# අන්තර්ගත පටුන


1. ආර්ථික ප්‍රතිසංස්කරණ හා පොදු සැපයීම් අමාත්‍යාංශය
අමාත්‍යාංශයේ කාර්ය භාරය ………………………………………………1

**2.** ආහාර කොමසාරිස් දෙපාර්තමේන්තුව
2.1 හැඳින්වීම…………………………………………………………….5
2.2 අරමුණු ………………………………………………………...5
2.3 ප්‍රධාන ක්‍රියාකාරකම්…………………………………………………5
2.4 පරිපාලන ව්‍යුහය සහ කාර්ය මණ්ඩලය ………………………………6
2.5 අධිකරණ කටයුතු ……………………………………………………7
2.6 දෙපාර්තමේන්තුවේ නිවාස සහ ගබඩා ………………………………..7
2.7 ව්‍යාපෘතීන්හි භෞතික හා මූල්‍යමය ප්‍රගතිය -2018……………………..11

3. ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව
3.1 හැඳින්වීම ……………………………………………………..12
3.2 ඉටු කරන ලද ප්‍රධාන කාර්යයන් ……………………………………12
4. ප්‍රතිපත්ති අධ්‍යයන ආයතනය
4.1 හැඳින්වීම……………………………………………………….22
4.2 පර්යේෂණ ……………………………………………………..22
4.3 ප්‍රකාශන………………………………………………………...26
4.4 ප්‍රතිපත්තිමය මැදිහත්වීම් ……………………………………..27

5. සුවසැරිය පදනම
5.1 හැඳින්වීම ……………………………………………………..29

# අන්තර්ගත රූප පටුන

රූපසටහන 1: කාර්මික නිෂ්පාදන දර්ශකය නොවැම්බර් 2017-ඔක්තෝබර්.2018………………..13

රූප සටහන 2: 2008-2018 ශ්‍රී ලංකාවේ වී නිෂ්පාදනය පිළිබඳ ඇස්තමේන්තු ……………………14

රූපසටහන 3: රැකියා වියුක්ති අනුපාතිකය වයස සහ ස්ත්‍රී, පුරුෂභාවය අනුව රැකියා වියුක්ති අනුපාතිකය ……………………………………………………………………………...16

රූපසටහන 4: කොළඹ පාරිභෝගික මිල දර්ශකය (කො. පා. මි. ද): පදනම් 2013 =100) ………...19

රූපසටහන 5: කොළඹ පාරිභෝගික මිල දර්ශකය (කො. පා. මි. ද): පදනම් 2013 = 100 ………...19

රූප සටහන 6: සෑම මසකම මෙහෙයවූ සිදුවීම් ගණන …………………………………………..31

රූප සටහන7: පළාත් අටක් අතර සිදුවීම් බෙදා හැරීම …………………………………………...32

රූප සටහන 8: මාසික සාමාන්‍ය ප්‍රතිචාර කාලය - අදියර I ………………………………………33

රූප සටහන 9: මාසික සාමාන්‍ය ප්‍රතිචාර කාලය - අදියර II …………………………………....33

රූප සටහන 10: සිදුවීම් බෙදී ගිය ආකාරය ……………………………………………………..34

# අන්තර්ගත වගු ලැයිස්තුව

වගුව 1: පරිපාලන ව්‍යුහය සහ කාර්ය මණ්ඩලය ....................6
වගුව 2:අධිකරණ කටයුතු ....................7
වගුව 3: ගබඩා දෙපාර්තමේන්තුව ....................7
වගුව 4: ගබඩාවන්හි අදායම ....................8
වගුව 5: 2018/12/31 වන විට නිවාස වල තොරතුරු ....................8
වගුව 6: නිවෙස් වල ආදායම ....................8
වගුව 7:වත්කම් සහ දේපළ ....................9
වගුව 8: පුනරාවර්තන වියදම් ....................9
වගුව 9 : ප්‍රාග්ධන වියදම් ....................10
වගුව 10: මූල්‍යමය මූලාශ්‍රයන් ....................11
වගුව 11: ව්‍යාපෘතීන්හි භෞතික හා මූල්‍යමය ප්‍රගතිය -2018 ....................11
වගුව 12: ශ්‍රම බලකා සමීක්ෂණය - 2018 (II කාර්තුව) ....................16
වගුව 13: අදියර II දියත් කිරීම ....................30
වගුව 14: සෑම මසකම මෙහෙයවූ සිදුවීම් ගණන....................30
වගුව 15: මාසිකව බඳවාගත් නිලධාරීන්....................35
වගුව 16: 2018 සේවක පුහුණුව....................37

# 1. ආර්ථික ප්‍රතිසංස්කරණ හා පොදු සැපයීම් අමාත්‍යාංශය

ආර්ථික ප්‍රතිසංස්කරණ හා පොදු සැපයීම් අමාත්‍යාංශය 2019.01.11 දින සිට 2018.12.28 දිනැති අංක 2013/34 දරණ අති විශේෂ ගැසට් පත්‍රයෙන් හා පසුව සංශෝධිත අංක 2106/10 දරන 2019.01.16 දිනැති ගැසට් පත්‍රයෙන් ස්ථාපිත නව අමාත්‍යාංශයකි.

ආර්ථික ප්‍රතිසංස්කරණ හා පොදු සැපයීම් අමාත්‍යාංශය දළ ජාතික නිෂ්පාදනය වැඩි දියුණුකිරීම හා පවත්වාගෙන යාම උදෙසා දත්ත මත පදනම් වූ ආර්ථික ප්‍රතිසංස්කරණ හා ප්‍රතිපත්ති සහ වැඩසටහන් සැකසීමටත් වග වන අතර, ආර්ථික ප්‍රතිසංස්කරණ හා පොදු සැපයීම් අමාත්‍යාංශය යටතේ පවත්නා දෙපාර්තමේන්තු රාජ්‍ය සංස්ථා සහ ව්‍යවස්ථාපිත ආයතනයන්හි ආර්ථික ප්‍රතිපත්ති හා පොදු සැපයුම්, ජීවන වියදම්, ආහාර සැපයුම් හා බෙදාහැරීම් යන විෂයන්ට අදාළව ආර්ථික ප්‍රතිසංස්කරණ ප්‍රතිපත්ති පිළිබඳ ප්‍රතිපත්ති සහ වැඩසටහන් සැකසීම, ක්‍රියාත්මක කිරීම, පසුවිපරම හා ඇගයීම යන කටයුතු ඉටු කරයි.

## අමාත්‍යාංශයේ කාර්ය භාරය

1. ආර්ථික ප්‍රතිසංස්කරණ සහ පොදු සැපයීම් හා ආහාර සැපයීම සහ බෙදාහැරීම පිළිබඳ විෂයන්ට අදාළ ප්‍රතිපත්ති, වැඩසටහන් සම්පාදනය කිරීම, පසුවිපරම් කිරීම සහ ඇගයීම.

2. මෙම අමාත්‍යාංශය යටතට ගැනෙන දෙපාර්තමේන්තු, ව්‍යවස්ථාපිත ආයතන, රාජ්‍ය සංස්ථා පහත පරිදි වේ.

i. ආහාර කොමසාරිස් දෙපාර්තමේන්තුව
ii. ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව
iii. පවුල් ආර්ථික ඒකකය
iv. දත්ත විශ්ලේෂණ ඒකකය
v. 1990 සුව සැරිය පදනම
vi. ආයෝජන කාර්ය සාධක බලකාය
vii. ප්‍රතිපත්ති අධ්‍යයන ආයතනය

3. දළ ජාතික නිෂ්පාදිතය වර්ධනය කිරීමට හා පවත්වා ගැනීමට අවශ්‍ය ආර්ථික ප්‍රතිසංස්කරණ ප්‍රතිපත්ති සහ වැඩසටහන් සකස් කිරීම.

4. ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යවරයා විසින් සකස් කරන්නා වූ ජාතික ප්‍රතිපත්තීන්ට අදාළ ආර්ථික සහ දත්ත විශ්ලේෂණය සිදු කිරීම.

5. ජීවන වියදම් අධීක්ෂණය සහ අමාත්‍ය මණ්ඩලයට අවශ්‍ය නිර්දේශ ඉදිරිපත් කිරීම.

6. පවුල් ආර්ථික ඒකකය අධීක්ෂණය.

7. ආහාර තොග පවත්වා ගැනීම.

8. සමුපකාර සහ පෞද්ගලික අංශ සමඟ ඒකාබද්ධව ඵලදායී බෙදාහැරීමේ පද්ධතියක් සකස් කිරීම.

9. සමුපකාර තොග වෙළඳ සංස්ථාව සහ සීමාසහිත ලංකා සතොස සමග සම්බන්ධීකරණයෙන් ඵලදායී ආහාර බෙදාහැරීමේ ක්‍රමවේදයක් දීප ව්‍යාප්තව සුරක්ෂිත කිරීම.

10. 1990 සුවසැරිය ගිලන්රථ සේවා ව්‍යාප්තිය සම්බන්ධීකරණය.

11. ජාතික ප්‍රතිපත්ති ඇගයීම හා අධීක්ෂණයට අදාළව ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යවරයාට සහාය වීම.

12. සමාජ ආර්ථික ගැටළු සම්බන්ධයෙන් රජයට විශ්වසනීය දැක්මක් ඉදිරිපත් කිරීම සඳහා වන ප්‍රතිපත්තිමය කරුණු පිළිබඳව උසස් තත්වයේ, ස්වාධීන පර්යේෂණ පැවැත්වීම.

13. මෙහි දැක්වෙන ආයතනයන්ට පැවරී ඇති අනෙකුත් සියලුම විෂයන්ට අදාළ කටයුතු.

රජය විසින් පවරා ඇති කාර්ය භාරය අනුව මෙම අමාත්‍යාංශය විසින් ජාතික ප්‍රතිපත්ති අමාත්‍යවරයාට සහ ජීවන වියදම සඳහා වූ අමාත්‍ය මණ්ඩල අනු කමිටුවට තත්‍ය කරුණු පාදක කොටගත් නිර්දේශ ඉදිරිපත් කිරීමට බැඳී සිටී. පෙර පැවති ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යාංශය විසින් යොදාගත් ක්‍රමවේදය ඉදිරියට ගෙනයමින් මෙම අමාත්‍යාංශය විශේෂයෙන් විශ්ලේෂක අංශයක් හා පවුල් ආර්ථික ඒකකය යන අළුතින් ස්ථාපිත ඒකක යොදාගෙන ප්‍රතිපත්ති හා ක්‍රමවේද පිළිබඳව පර්යේෂණ, සාක්ෂි මත පදනම් වූ කරුණු මත ගොඩනැඟුනු ප්‍රතිපත්ති සකස් කිරීම දක්වා අවශ්‍ය වන පසුබිම නිර්මාණය කිරීමෙහි නියැලී සිටී. මෙම විශ්ලේෂක අංශය 2018 දී පිහිටුවන ලද අතර එය සාක්ෂි මත පදනම් වූ තීරණ සඳහා අවශ්‍ය විශ්ලේෂන සිදු කිරීම කරනු ලබයි. මෙම අංශය දත්ත විද්‍යාව, ආර්ථික විද්‍යාව, මූල්‍යකරණය, තොරතුරු තාක්ෂණය, රාජ්‍ය ප්‍රතිපත්ති යන ක්ෂේත්‍රයන්ට අදාළ තරුණ උපාධිධාරීන්ගෙන් පිහිටුවා ඇත.

**ගඩොලේ සිට අන්වීක්ෂය දක්වා**

- රටේ ප්‍රාග්ධන වියදම් අධ්‍යයනය කිරීමෙන් පසු හෙළි වූයේ අධ්‍යාපන අමාත්‍යාංශයේ වියදම්වලින් 60%ක්ම වැය වන්නේ ගොඩනඟිලි හා ව්‍යුහයන් නිර්මාණය කිරීම පිණිස බවයි. අධ්‍යාපන අමාත්‍යාංශයේ වියදම්වලින් නව පර්යේෂණාගාර උපකරණ, පරිගණක සහ අනෙකුත් අධ්‍යාපන උපකරණ මිල දී ගැනීම් යනාදී අධ්‍යාපනයේ ගුණාත්මක සංවර්ධනයට ඉවහල් වන වියදම් 5%ක් වැනි වූ (දළ වශයෙන් රු.මි.800ක්) සුළු ප්‍රමාණයක් බව පෙන්නුම් කරන ලදි.
- 2018 දී සිදු කළ එම අධ්‍යයනයෙන් පසු ගොඩගැඹිලි සහ ව්‍යුහන් සඳහා නොව වැඩි ප්‍රාග්ධනයක් යොමු විය යුත්තේ අධ්‍යාපනයේ ගුණාත්මක සංවර්ධනය සඳහා බව යෝජනා කරන ලදි.

**උෂ්ණත්වය හා ආර්ද්‍රතාවය පාලනය කරන ගබඩා ජාලයක් සහ දඹුල්ල ශීතාගාරය**

- විවිධ භෝග වල ඍතු හඳුනා ගැනීම සඳහා විශ්ලේෂණ අංශය මඟින් අධ්‍යයනයක් සිදු කරන ලදී.
- සුදුසු සහ ප්‍රමාණවත් ගබඩා පහසුකම් නොමැතිවීම හේතුවෙන් ධාන්‍ය චක්‍රය තුළ ඇති බොහෝමයක් භෝග අපතේ යන බවත් / සත්ත්ව ආහාර ලෙස යොදවන බවත් සොයාගන්නා ලදි.

එම විශ්ලේෂනයට අනුව නරක් වූ අයිතම නාස්ති කිරීම අවම කිරීම සඳහා මෙ.ටො.5000ක ධාරිතාවයකින් යුත් උෂ්ණත්ව පාලක ගබඩාවක් දඹුල්ලේ පිහිටුවීමට යෝජනා කරන ලදි. මෙම පහසුකම ලංකාවම ආවරණය වන පරිදි ඵලදායි ජාලයක් නිර්මාණය කිරීම සඳහා උත්ප්‍රේරකයක් වශයෙන් සැලකිය හැක. මෙමඟින් බලාපොරොත්තු වනුයේ ගොවීන් සඳහා දේශීය වෙළඳ පොල

අභිබවා අපනයන වෙළඳ පොලවල් කරා ලඟා වීමට අවස්ථා නිර්මාණය කරන අන්දමේ නවීන සහ උසස් තත්ත්වයේ මධ්‍යස්ථාන බිහි කිරීමයි.

දඹුල්ල මෙ.ටො.5000ක ධාරිතාවයකින් යුත් උෂ්ණත්ව පාලක ගබඩා සංකීර්ණය සඳහා රු.මි.550ක පමණ මුළු වියදමක් දැරිය යුතු වන අතර ඉන්දියානු රජය විසින් රු.මි.300ක් ප්‍රදාන වශයෙන් පිරිනැමීමට ඉදිරිපත් වී ඇත. මේ වන විට ඉදි කිරීම් සඳහා වන කොන්ත්‍රාත්තුව පිරිනැමීමට නියමිත අතර 2019 දී ඒය ඉදි කර නිම කිරීමට බලාපොරොත්තු වේ.මෙම ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරනුයේ ආහාර කොමසාරිස් දෙපාර්තමේන්තුව මඟිනි.

පසු අස්වනු හානි අවම කිරීම උදෙසා ඵලදායී ගබඩා පහසුකම් ඇති කිරීමේ අවශ්‍යතාවය සැලකිල්ලට ගෙන තෝරාගත් දිස්ත්‍රික්කවල අමතර උශ්ණත්ව පාලන ගබඩා 05ක් පිහිටුවීමට යෝජනා කර ඇත. දඹුල්ල ගබඩා සංකීර්ණය ඉදිකිරීමෙන් පසු රජය විසින්, නවීන උශ්ණත්ව පාලන ගබඩා ජාලයක් පෞද්ගලික අංශය විසින් ඒවා කළමනාකරණ සහ මෙහෙයුම් කිරීම පිණිස යොදාගෙන කටුනායක, ඇඹිලිපිටිය,යාපනය, කැප්පෙටිපොල පිහිටුවීමට ආයෝජන යොදවනු ඇත.

**සුළු හා මධ්‍ය පරිමාණ මෝල්හිමියන්ගේ ණය**

2000 වර්ෂය වන විට සිටි 2000ක් පමණ වූ ක්‍රියාකාරී සුළු හා මධ්‍ය පරිමාණ මෝල් සංඛ්‍යාව මේ වන විට 800ක් පමණ දක්වා අඩු වී ඇති බව සමහර ඇස්තමේන්තු පෙන්නුම් කරයි. එම මෝලි හිමිකරුවන් බොහෝමයක් ද මේ වන විට කඩා වැටී ඇති බව වාර්තා වේ. මෙම තත්ත්වය හේතුවෙන් මහා පරිමාණයේ වී මිල දී ගන්නන් කිහිප දෙනෙකු විසින් ඇති කරන ලද කතිපයාධිකාරී තත්ත්වයක් නිර්මාණය වී ඇත.

- ණය ගෙවීම පැහැර හරින ලද අයගේ තොරතුරු සියළුම බැංකුවලින් එකතු කරමින් විශ්ලේෂනයන් සිදු කරන ලදි.

සුළු හා මධ්‍ය පරිමාණ ගොවීන් සඳහා තිරසාර විසඳුමක් සැපයීම මඟින් වෙළඳ පොල තුළ තරඟකාරීත්වයක් නිර්මාණය කිරීමත් සහල් මිල ස්ථාවර තත්ත්වයකට ගෙන ඒමත් පිණිස සියලු පාර්ශවකරුවන් සමඟ සාකච්ඡා පැවැත්වීය. මෙම සාකච්ඡා ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යාංශය විසින් මින් පෙර සිදු කරන ලද සාකච්ඡා ක්‍රියාවලියේ දිගුවකි.සියළුම පාර්ශවකරුවන් සමඟ සිදු කරන ලද සාකච්ඡා මාලාවේ ප්‍රතිඵලයක් ලෙස 300ක් පමණ වූ කඩා වැටුණු සුළු හා මධ්‍ය පරිමාණ මෝල් හිමියන් සංඛ්‍යාවට සිය කටයුතු නැවත ආරම් කිරීම සඳහා එකවරක් පමණක් ලබා දෙන ආකාරයේ අරමුදල් සැපයීමක් විධිමත් අධීක්ෂණ ක්‍රමවේදයක් යටතේ සිදු කිරීමට නිර්දේශ කරන ලදි. මෙම ක්‍රියාවලියේදී ණය පැහැර හරිනමෝල් හිමියන් සම්බන්ධයෙන් වගකීම දිස්ත්‍රික් සහල් නිෂ්පාදනකරුවන්ගේ සමූපකාර සමිතියට පැවරෙමින් ශක්තිමත් නෛතික ගිවිසුමක් අත්සන් කරනු ඇත. කැබිනට් මණ්ඩලය විසින් මෙම වැඩසටහන අනුමත කරන ලද අතර මේ වන විට එය ක්‍රියාත්මක මට්ටමේ පවතී. මෙම වැඩසටහන ක්‍රියාත්මක කිරීම සඳහා කෘෂිකර්ම අමාත්‍යාංශයට රුපියල් බිලියනයක් ලබා දී ඇත.

**ජීවන වියදම් පිළිබඳ රජයේ උපාය මාර්ගික ප්‍රවේශය**

අමාත්‍ය මණ්ඩලය විසින් මෙම අමාත්‍යාංශයට ජීවන වියදම් පිළිබඳ අමාත්‍ය මණ්ඩල අනු කමිටු රැස්වීම් කැඳවීම පවරා ඇත. ඒ අනුව මහජනතාවගේ ජීවන වියදම වැඩි කිරීමට බලපාන කරුණු සම්බන්ධයෙන් විවිධ ප්‍රතිපත්ති හා නියාමන මිනුම් නිර්දේශ කිරීම අරබයා පත් කර ඇති මෙම කමිටුව දෙසතියකට වතාවක් රැස්වන අතර ජීවන වියදම පිළිබඳ සියළු කරුණු මෙහි දී විවරණයට ලක් වේ. එහිදී එළඹෙන විවිධ කරුණු අරබයා පර්යේෂණ හා සමීක්ෂණ සිදු කිරීමේත් අදාල සියළු පාර්ශවකරුවන් සමඟ ගැඹුරින් සාකච්ඡා කොට නිර්දේශ ඉදිරිපත් කිරීමේත් වගකීම මෙම අමාතයාංශයට පැවරේ. එවැනි දත්ත විශ්ලේෂණ සිදු කරනුයේ දත්ත විශ්ලේෂණ අංශය විසින් වන අතර පවුල් ආර්ථික ඒකකය විසින් මෙම සමස්ත ක්‍රියාවලිය සිදු කරනු ලබයි.

ඉහත කී සාකච්ඡා බොහෝමයක් සිදු කරනු ලබන්නේ භාණ්ඩාගාරය, ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යාංශය, කෘෂිකර්ම අමාත්‍යාංශය හා කර්මාන්ත හා වාණිජ කටයුතු අමාත්‍යාංශය යනාදී

අමාත්‍යාංශය හා පාරිභෝගික කටයුතු අධිකාරිය, ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව ආදී රාජ්‍ය ආයතනත් අදාළ පෞද්ගලික ආයතනත්ය.

ජීවන වියදම අරබයා පාරිභෝගිකයන්ගේ දැක්ම පිළිබඳ සමීක්ෂණයක් සිදු කෙරේ. එමඟින් වේගයෙන් සංසරණය වන පාරිභෝගික භාණ්ඩ ප්‍රමාණ සම්බන්ධයෙන් සංඛ්‍යාත්මක දත්ත හිඟකමක් ඇති බවක් පෙන්නුම් කරන ලදි. එහිදී අනාවරණය වූයේ ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව මඟින් සිදු කරන කොළඹ පාරිභෝගික මිල දර්ශකය හා ජාතික පාරිභෝගික මිල දර්ශකය හරහා ආවරණය කරනුයේ පාරිභෝගික භාණ්ඩවල මිල පමණකි. ශ්‍රී ලංකා වෙළඳ පොල සමීක්ෂණ සංගමය සමඟ එළඹි ගිවිසුමක් හරහා මෙම සමීක්ෂණය සිදු කරන ලද අතර එසේ සපයාගන්නා ලද දත්ත විශ්ලේෂක අංශය මඟින් යොදාගනු ලබයි.

කිරිපිටි මිල සූත්‍රය

- ලෝක කිරි වෙළඳ මිල ගණන් ප්‍රවනතා, රේගු දත්ත සහ ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තු දත්ත යොදාගෙන මූලික විශ්ලේෂණයක් සිදු කරන ලදි. පසුගිය වසර ගණනාවක් පුරා කිරිපිටි සඳහා නියාමන මිලක් පැවතුණි. එසේ වුවද ඉහත විශ්ලේෂණය මඟින් පෙන්නුම් කරන ලද්දේ එම කාලය පුරා ලෝක වෙළඳ පොලෙහි පැවති පැහැදිලි මිල උච්චාවචනය මඟින් කිසිඳු වාසියක් අදාළ කිසිඳු පාර්ශවයකට සාධාරණව බෙදී නොගොස් ඇති බවයි. ඒ වෙනුවට සිදුව ඇත්තේ එම තත්ත්වය සියළු පාර්ශව වෙත අවාසිදායක ලෙස බලපා තිබීමයි.

විශ්ලේෂණ අංශය හා පාරිභෝගික අධිකාරිය, පත් කරන ලද තාක්ෂණික කමිටුව සමඟ එක් වී මේ සඳහා අවශ්‍ය සියළු සාකච්ඡා මෙහෙයවා කිරිපිටි සඳහා මිල සූත්‍රයක් ප්‍රතිෂ්ඨාපනය කරන ලදි. එම මිල සූත්‍රය සඳහා අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලැබුණු අතර එය මේ වන විට ක්‍රියාත්මක මට්ටමේ පවතී.

# 2. ආහාර කොමසාරිස් දෙපාර්තමේන්තුව

## 2.1 හැඳින්වීම

**දැක්ම**
"සෑම නිවසකටම ආරක්ෂාකාරී, කල්පවත්නා, පෝෂ්‍යදායී ධාන්‍යමය ආහාරයක්."

**මෙහෙවර**
"දෙපාර්තමේන්තු වත්කම් හා ආහාර දෙපාර්තමේන්තුවේ සහ පාර්ශවකරුවන්ගේ කැපවූ හා කැපවූ කාර්යමණ්ඩල සාමාජිකයන් සමග වෙළඳපොළ කළමනාකරණය කිරීම හා ඒවාට සම්බන්ධ කිරීම මගින් ශ්‍රී ලංකාවේ පුරවැසියන් සඳහා සාරවත් ධාන්‍ය ආහාර ලබාගැනීම, ප්‍රවේශය හා මිල දරාගැනීමේ හැකියාව සහතික කිරීම."

## 2.2 අරමුණු

- ආහාර සුරක්ෂිතතාව තහවුරු කිරීම සඳහා අවශ්‍ය සහල් තොග කලමනාකරණය කිරීම හාල් මිල ස්ථාවරව තබා ගැනීමට අවශ්‍ය සහාය සහ දායකත්වය දැක්වීම
- විද්‍යාත්මකව වැඩිදියුණු කළ ගබඩා පහසුකම් නඩත්තු කරමින් උසස් තත්ත්වයේ පලිබෝධනාශක වලින් තොර ආහාර පාරිභෝගිකයින්ට සැපයීම
- දෙපාර්තුමේන්තු සේවාවන් කාර්යක්ෂමව කළමනාකරණය කිරීම හරහා රජයේ ආදායම වැඩි කිරීම සඳහා දායක වීම

## 2.3 ප්‍රධාන ක්‍රියාකාරකම්

- කොළඹ ප්‍රකාශනය හා දකුණු ආසියානු කලාපීය සහයෝගිතා සංවිධානයෙහි (SAARC) 16 වන සමුළුව අනුව මෙ.ටො.8000ක විශේෂ සහල් තොගයක් නඩත්තු කිරීම.
- 2018.08.28 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණ අනුව දිවයින පුරා ආහාර දෙපාර්තමේන්තුවෙහි ගබඩා තුළ  මෙ.ටො.100,000ක ආරක්ෂිත සහල් තොග නඩත්තු කිරීම
- වෙළඳ පොල තුළ සහල් පවත්නා බවට සහතික කිරීම
- දෙපාර්තමේන්තු සම්පත් මනා සේ කළමනාකරණය කිරීම සඳහා අදාළ පාර්ශවයන් සමග ඵලදායි සම්බන්ධීකරණය ඇති කිරීම.
- පලිබෝධනාශක රහිත ධාන්‍ය ආහාර ගබඩා පරිසරයක් ඇති කිරීම.

## 2.4. පරිපාලන ව්‍යුහය සහ කාර්ය මණ්ඩලය

*වගුව 1: පරිපාලන ව්‍යුහය සහ කාර්ය මණ්ඩලය*

| | තනතුර | අනුමත සේවක ගණන | 31.12.2018 තත්‍ය සේවක සංඛ්‍යාව |
|---|---|---|---|
| 01 | ආහාර කොමසාරිස් | 01 | 01 |
| 02 | ප්‍රධාන ගණකාධිකාරී | 01 | 01 |
| 03 | නියෝජ්‍ය ආහාර කොමසාරිස් / සහකාර ආහාර කොමසාරිස් | 02 | 01 |
| 04 | ගණකාධිකාරී | 01 | 01 |
| 05 | පරිපාලන නිලධාරී | 01 | - |
| 06 | පරිවර්තක | 01 | - |
| 0 7 | තත්ත්ව පාලන නිලධාරී | 01 | 01 |
| 08 | ධාන්‍ය සමීක්ෂක | 01 | 01 |
| 09 | වැඩ පරීක්ෂක | 02 | 01 |
| 10 | තොරතුරු සහ සන්නිවේදන සහකාර | 01 | 01 |
| 11 | රාජ්‍ය කළමනාකරණ සහකාර | 82 | 24 |
| 12 | සංවර්ධන නිලධාරී | 22 | 10 |
| 13 | වාප්පු ක්ෂේත්‍ර | 08 | 08 |
| 14 | රියදුරු | 10 | 07 |
| 15 | කාර්යාල කාර්යය සහයක | 22 | 08 |
| 16 | ධූමායනකරු | 26 | 08 |
| 17 | රිය සහකරු | 02 | 08 |
| 18 | වාප්පු ක්ෂේත්‍ර කම්කරු | 01 | 01 |
| 19 | මුරකරු | 17 | 17 |
| 20 | ගබඩා කම්කරු | 24 | 02** |
| එකතුව | | 227 | 101 |

** ගබඩා කම්කරු තනතුර සඳහා එක කම්කරුවකු ආදේශක පදනම යටතේ ද, අනිත් කම්කරු තාවකාලික පදනම යටතේද බඳවා ගෙන ඇත .

## 2.5 අධිකරණ කටයුතු

2018 වර්ෂය අවසානය වන විට අහාර දෙපාර්තමේන්තුවේ අධිකරණ කටයුතු පහත සඳහන් පරිදි දැක්විය හැක.

*වගුව* 2:අධිකරණ කටයුතු

| අංකය. | ස්වභාවය | සිදුවෙමින් පවතින අධිකරණ කටයුතු ගණන |
|---|---|---|
| **01** | ආපසු අයකර ගැනීමේ අධිහාර | 01 |
| **02** | හිග ගබඩා කුලී අධිහාර | 06 |
| **03** | හිග ගබඩා කුලී අධිහාර | 08 |
| **04** | ධාන්‍යාගම නිවාසවල අයිතිය ඉවත්කිරිම. | 42 |
| **05** | අපරාධ විමර්ශන දෙපාර්තමේන්තුව මගින් මෙහෙයවන ලද නඩු | 05 |

## 2.6 දෙපාර්තුමේන්තුවට අයත් නිවාස සහ ගබඩා

### දෙපාර්තමේන්තු ගබඩා

ආහාර දෙපාර්තමේන්තුවේ 120 ක් පමණ වන ගබඩා දිවයින පුරා දිස්ත්‍රික්ක 21 ක් පුර පිහිටා ඇත. රාජ්‍ය දේපල විධිමත්ව කළමනාකරණය කිරීමේ දැක්ම ඇතිව ඒවා පහත දැක්වෙන අරමුණු සඳහා යොදා ගැනිණි. 2018/12/31 වන විට ගබඩාවන්හි දත්ත පහත සඳහන් පරිදි වේ.

*වගුව* 3: ගබඩා

| | ගබඩාව | ප්‍රමාණය |
|---|---|---|
| **1.** | පොදු සහ රාජ්‍ය ආයතන සඳහා මාසික බදුකුලීයක් යටතේ බද්දට දීම. | 48 |
| **2.** | පොදු ආයතන සඳහා බදුකුලී අයකිරීමකින් තොරව බද්දට දීම | 29 |
| **3.** | ආහාර දෙපාර්තමේන්තුව මගින් භාවිතා කරන ගබඩා | 21 |
| **4.** | දිස්ත්‍රික් ලේකම්/පළාත් ලේකම් යටතේ පවතින ගබඩා | 20 |
| **5.** | අත් හරින ලද ගබඩා | 02 |
| **එකතුව** | | 120 |

**ගබඩා වල ආදායම**

*වගුව* 4: ගබඩාවන්හි අදායම

| වර්ෂය | ලැබිය යුතු ආදායම රු. | ලැබුණු ආදායම රු. |
|---|---|---|
| **2017** | 80,705,635.64 | 101,130,285.86 |
| **2018** | 94,534,201,96 | 80,980,062.31 |

දෙපාර්තමේන්තුවට අයත් නිවාස

ආහාර දෙපාර්තමේන්තුව යටතේ ඇති 366 ක් පමණ වන නිවාස ධාන්‍යගම, ත්‍රිකුණාමලයේ චීන වරායේ පිහිටා ඇති අතර ඒවා පහත සඳහන් පරිදි භාවිතා කරනු ලැබේ.

*වගුව* 5: 2018/12/31 වන විට නිවාස වල තොරතුරු

| | **නිවාස** | සංඛ්‍යාව |
|---|---|---|
| **1** | ආහාර දෙපාර්තමේන්තුවේ කාර්යාලය | 01 |
| **2** | සංචාරක බංගලා | 01 |
| **3** | ප්‍රතිසංස්කරණය කල යුතු නිවාස | 18 |
| **4** | කුලී නිවාස | |
| 5 | ප්‍රීමා ආයතනයේ වෘත්තිකයන් | 182 |
| 6 | පුද්ගලික | 01 |
| 7 | රාජ්‍ය නිලධාරීන් | 61 |
| 8 | ත්‍රිවිධ හමුදාව සහ පොලීසිය | 55 |
| 9 | අර්ධ රාජ්‍ය සංවිධාන | 47 |
| | **එකතුව** | **366** |

*වගුව* 6: නිවෙස් වල ආදායම

| වර්ෂය | ලැබිය යුතු ආදායම රු. | ලැබුණු ආදායම රු. |
|---|---|---|
| **2017** | 5,846,234.00 | 5,734,943.27 |
| **2018** | **2,154,816.00** | **5,889,756.72** |

**වත්කම් සහ දේපළ**

ආහාර දෙපාර්තමේන්තුවේ 2018/12/31 වන විට වත්කම් වටිනාකම් විශ්ලේෂණය පහත පරිදි වේ.

*වගුව* 7:වත්කම් සහ දේපළ

| | **වත්කම** | **2018/12/31 වන විට වටිනාකම රු.** |
|---|---|---|
| **1.** | ගොඩනැගිලි හා ඉදිකිරීම් | 886,004,500,00 |
| **2.** | වාහන | 24,447,000.00 |
| **3.** | යන්ත්‍රෝපකරණ | 6,558,942,12 |
| **4.** | ගෘහ භාණ්ඩ සහ කාර්යාලයීය උපකරණ | 1,136,415,500.00 |
| | **එකතුව** | 2,053,425,942.12 |

**මූල්‍ය වාර්තා**

| | | |
|---|---|---|
| ශීර්ෂ අංකය | : | 300 |
| අමාත්‍යාංශය /දෙපාර්තමේන්තුව | : | ආහාර කොමසාරිස් දෙපාර්තමේන්තුව |
| වැඩසටහන් අංකය | : | 01 |
| ව්‍යාපෘති අංකය | : | 01 |

**පුනරාවර්තන වියදම්**

*වගුව* 8: පුනරාවර්තන වියදම්

| විස්තරය | **2017 වියදම රු.** | **2018 අනුමත ඇස්තමේන්තුව රු.** | **2018 සංශෝධිත ඇස්තමේන්තුව රු.** | **2018 වියදම රු.** | **2018 ශේෂය රු.** |
|---|---|---|---|---|---|
| පෞද්ගලික වැටුප් | 51,619,509 | 53,000,000 | 53,200,000 | 52,927,589 | 272,411 |
| වෙනත් | 477,811,826 | 35,720,000 | 32,470,000 | 30,976,852 | 1,493,148 |
| එකතුව | 529,431,335 | 88,720,000 | 85,670,000 | 83,904,441 | 1,765,559 |

## ප්‍රාග්ධන වියදම්

*වගුව 9:ප්‍රාග්ධන වියදම්*

| අරමුණ | විස්තරය | 2017 සැබෑ වියදම රු. | 2018 අනුමත ඇස්තමේන්තුව රු. | 2018 සංශෝධිත ඇස්තමේන්තුව රු. | 2018 සැබෑ වියදම රු. | 2018 ශේෂය රු. |
|---|---|---|---|---|---|---|
| 2001 | ගොඩනැගිලි හා ඉදිකිරීම් | 176,904,303 | 98,000,000 | 128,850,000 | 128,199,551 | 650,449 |
| 2002 | යන්ත්‍රෝපකරණ | 24,000 | 250,000 | 250,000 | 221,019 | 28,981 |
| 2003 | වාහන | 489,245 | 600,000 | 6**00,000** | 587,212 | 187,212 |
| 2102 | ගෘහ භාණ්ඩ සහ කාර්යාලයීය උපකරණ | 2,003,964 | 500,000 | 2,9**00,000** | 2,895,460 | 4,540 |
| 2103 | යන්ත්‍රෝපකරණ | 268,980 | 200,000 | 2**00,000** | 189,750 | 10,250 |
| 2401 | පුහුණු සහ ශක්‍යතා ඉහළ නැංවීම | 443,735 | 400,000 | 40**0,000** | 399,500 | 500 |
| 2502 | ආහාර දෙපාර්තමේන්තුවේ ගබඩා අලුත්වැඩියාව | - | - | - | - | - |
| | එකතුව | 180,131,227 | 99,950,000 | 133,200,000 | 132,492,492 | 707,508 |

මූල්‍යමය මූලාශ්‍රයන්

*වගුව 10: මූල්‍යමය මූලාශ්‍රයන්*

| විස්තරය | **2017** සැබෑ වියදම රු. | 2018 අනුමත ඇස්තමේන්තුව රු | 2018 සංශෝධිත ඇස්තමේන්තුව රු. | 2018 සැබෑ ඇස්තමේන්තුව රු. | 2018 ශේෂය රු. |
|---|---|---|---|---|---|
| Consolidated Fund | 253,042,562 | 188,670,000 | 218,870,000 | 214,238,699 | 4,631,301 |
| Writing off losses | 456,520,000 | - | 2,300,000 | 2,158,234 | 141,766 |

## 2.7 ව්‍යාපෘතීන්හි භෞතික හා මූල්‍යමය ප්‍රගතිය -2018

පහත දැක්වෙන බඩු ගබඩාවන් අලුත්වැඩියා කිරීම ;

*වගුව* 11: ව්‍යාපෘතීන්හි භෞතික හා මූල්‍යමය ප්‍රගතිය -2018

| විස්තරය | මූල්‍යමය ප්‍රගතිය | | | භෞතික ප්‍රගතිය (%) |
|---|---|---|---|---|
| | මුළු වගකීම (රු.) | 2018/12/31 දක්වා වූ ගෙවීම් 31 .12.2018 (රු.) | % | |
| 1.වේයන්ගොඩ- මහජන කටයුතු | 22774464.00 | 22774464.00 | 100 | 100 |
| 2.වේයන්ගොඩ- යාන්ත්‍රික කටයුතු | 64228442.31 | 31358652.81 | 48.82 | 75 |
| 3.අනුරාධපුර- ශාවස්ත්‍රිපුර | 30752430.58 | 19544878.5 | 63.56 | 90 |
| 4. ගාල්ල -බූස්ස | 49655737.49 | 35904774.57 | 72.31 | 75 |
| 5. මාතර-මැදවත්ත | 8944668.64 | 5480874.07 | 61.28 | 90 |

# 3. ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව

## 3.1 හැඳින්වීම

විවිධ අවශ්‍යතාවන් සඳහා අවශ්‍ය සංඛ්‍යානමය කරුණු එක්රැස්කිරීමේ, සකස් කිරීමේ සහ බෙදා හැරීමේ වගකීම පැවරී ඇති ප්‍රධාන රාජ්‍ය ආයතන ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව වේ. මෙම දෙපාර්තමේන්තුව ආර්ථික ප්‍රතිසංස්කරණ හා පොදු සැපයීම් අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක වේ.

ජනගහන, නිවාස ,කෘෂිකාර්මික, කාර්මික, වෙළඳ සේවා, රාජ්‍ය ගිණුම්, මිල සූත්‍ර සහ මිල ගණන් යනාදී විෂය ක්ෂේත්‍ර යටතේ වන්නා වූ ජාතික සැලසුම් සකස් කිරීම සඳහා අවශ්‍ය දත්ත දෙපාර්තමේන්තුව විසින් ලබාදීම සිදුකරයි.එසේම අනෙකුත් සමාජමය ක්‍රියාකාරකම් සඳහා කාලෝචිත ,විශ්වාසනීය සහ වැදගත් දත්ත එක්රැස් කිරීම, සකස් කිරීම සහ ලබාදීම සම්බන්ධයෙන් වගකීම් දරනු ලැබේ.

**දැක්ම**

දේශීය සංවර්ධන අභිමතාර්ථ සාක්ෂාත් කර ගැනීම සඳහා කාලීන තොරතුරු ලබාදීම තුළින් කලාපයේ පෙර ගමන්කරු වීම .

**මෙහෙවර**

ගෝලීයකරණ පසුබිමක් තුළ සමෘද්ධිමත් ජාතියක් බවට පත්වීම සඳහා නව තාක්ෂණය ,සේවක කැපවීම සහ උපායශීලී නායකත්වය තුළින් කාලීන වූත් නිවැරදි දත්ත ලබාදීම මඟින් වඩාත් ඵලදායි ලෙස දේශයෙහි සමාජ ආර්ථික සංවර්ධනයට දායක වීම. ගෝලීයකරණ පසුබිමක් තුළ සමෘද්ධිමත් ජාතියක් බවට පත්වීම සඳහා නව තාක්ෂණය ,සේවක කැපවීම සහ උපායශීලී නායකත්වය තුළින් කාලීන වූත් නිවැරදි දත්ත ලබාදීම මඟින් වඩාත් ඵලදායි ලෙස දේශයෙහි සමාජ ආර්ථික සංවර්ධනයට දායක වීම.

## 3.2 ඉටු කරන ලද ප්‍රධාන කාර්යයන්

### 3.2.1 ජන හා නිවාස සංගණනය -2021

2021 ජන හා නිවාස සංගණනය සඳහා සැලසුම් කිරීම 2017 ආරම්භ විය.මෙම 2021 සංගණනයේදී ටැබ්ලට් පරිගණක මඟින් දත්ත එක්රැස් කිරීමට සැලසුම් කර ඇත. ජන හා නිවාස සංගණනයේ ප්‍රථම පියවර වන සිතියම් සකස් කිරීම ,සංගණනයට වසර කිහිපයකට පෙර ආරම්භ කරයි.ඒ අනුව සිතියම් සකස් කිරීමේ පියවරෙහි ක්‍රියාකාරකම් 2017-2020 කාලසීමාව තුළ අදියර තුනකින් සිදුකිරීමට සැලසුම් කර ඇත. මෙම අදියර තුන යටතේ මීන් පෙර සංගණනය සඳහා සකස් කරන ලද ග්‍රාම නිලධාරී සිතියම් ඩිජිටල්කරණය කිරීම, සංගණන කාණ්ඩ නිර්ණය කිරීම මෙම පියවර තුන යටතේ සිදුකෙරේ.

සැලැස්ම අනුව දිස්ත්‍රික් 08 ක් සඳහා සිතියම් සකස් කිරීම 2017 දී ආරම්භ කරන ලද අතර සංගණන කාණ්ඩ ඩිජිටල්කරණය කිරීමද ආරම්භකර ඇත. 2018 වසර අවසාන වනවිට දිස්ත්‍රික්ක 18 ක ක්ෂේත්‍ර කටයුතු ආරම්භ කර එයින් 11 ක කටයුතු අවසන් කර ඇත.දිස්ත්‍රික්ක 03 ක සංගණන ඛාණ්ඩ ඩිජිටල්කරණය කිරීම සම්පූර්ණ කර ඇත.
ඒ අනුව සංගණන මෙහෙයුම් කමිටුව සහ උප කමිටු පහත සඳහන් අරමුණු සාක්ෂාත් කරගනු ලැබ ඇත.
2018 වසර අවසාන වනවිට දිස්ත්‍රික්ක 18 ක ක්ෂේත්‍ර කටයුතු ආරම්භකර එයින් 11 ක කටයුතු අවසන් කර ඇත.දිස්ත්‍රික්ක 03 ක census blocks ඩිජිටල්කරණය කිරීම සම්පූර්ණ කර ඇත.

ඒ අනුව සංගණන මෙහෙයුම් කමිටුව සහ උප කමිටු පහත සඳහන් අරමුණු සාක්ෂාත් කරගනු ලැබ ඇත.

- දත්ත සටහන් කිරීමේ ආකෘති පත්‍ර සහ දත්ත එකතු කිරීමේ ප්‍රශ්නාවලි කෙටුම්පත් කරිම සහ දිස්ත්‍රික්ක කිහිපයක පෙරහුරු සිදු කිරීම.
- දෙපාර්තමේන්තුවේ කාර්යමණ්ඩලය දැනුවත් කිරීමේ වැඩසටහන් පැවත්විම.
- දත්ත පරිහරණය කරනු ලබන පාර්ශවයන් සඳහා වැඩ සටහන් පැවත්වීමට මූලික පියවරයන් සම්පූර්ණ කිරීම.
- සංගණනයේ ප්‍රචාරණ සැලැස්ම සකස් කිරීම සහ එය 2019 වසරේ හඳුන්වා දීමට මූලික පියවර ගැනීම.
- සංගණනය සඳහා වූ ප්‍රසම්පාදන සැලැස්ම සකස් කිරීම, ප්‍රසම්පාදන ඒකකය පිහිටුවීම, ප්‍රසම්පාදන උප කමිටු නම් කිරීම.
- මූලික සංගණන කාණ්ඩ රෙජිස්ට්‍රිය සඳහා සැලැස්ම සහ ව්‍යුහය සකස් කිරීම.
- සංගණන අයවැය ඇස්තමේන්තුව සඳහා කැබිනට් මණ්ඩලයේ අනුමැතිය ලබා ගැනීම.
- දිස්ත්‍රික්ක 05ක් සඳහා වූ ගම්මාන ලැයිස්තු කෙටුම්පත් කිරීම.

### 3.2.2. (Conductions Statistical Literacy Enhancing Programme)

සංඛ්‍යාන දැනුම වැඩිදියුණු කිරීමේ වැඩසටහන් පැවැත්වීම.
මෙම වැඩසටහන යටතේ රාජ්‍ය නිලධාරීන් 1280ක් දැනුවත් කර ඇත.


### 3.2.3. තිරසර සංවර්ධන ඉලක්ක සඳහා දර්ශක පිළිබඳ වාර්තාව සකස් කිරීම.

තිරසර සංවර්ධන ඉලක්ක සම්බන්ධ දත්ත පද්ධතිය යාවත්කාලීන කර වෙබ් අඩවියෙහි පලකර ඇත.

### 3.2.4. කාර්මික නිශ්පාදන දර්ශකය (IIP)

2015 පාදක වර්ෂය ලෙස සලකමින් නිෂ්පාදන ක්ෂේත්‍රයේ කෙටිකාලීන වෙනස්වීම සහ ස්වභාවයන් හඳුනාගැනීම සඳහා IIP සකස් කරනු ලැබේ. 2016 වර්ෂයේදී කාර්තුමය වශයෙන් මෙම දර්ශකය එළිදැක්වුණු අතර 2017 සිට එය මාසිකව, දින 42ක කාලයකට පසුව ප්‍රකාශයට පත් කරනු ලැබේ.

2017 නොවැම්බර් සිට 2018 ඔක්තෝබර් දක්වා අදාළ IIP දත්ත 2018 දී ප්‍රකාශයට පත් කරන ලද අතර මෙහි ඇති රූප සටහනෙහි මේ දක්වා එහි විචලනය දක්වා තිබේ. ප්‍රාථමික සහ ද්විතීයික දත්ත භාවිතා කරමින් මෙම දර්ශකය සකස් කරනු ලැබේ.




*රූපසටහන 1- කාර්මික නිෂ්පාදන දර්ශකය නොවැම්බර් 2017- ඔක්තෝබර්.2018*

දත්ත එක්රැස් කිරීම, ගණනය කිරීම, දර්ශකය සකස් කිරීම 2018 වසරේ සිට නියමිත කාලයට සිදු කරන ලදි.

### 3.2.5 සංඛ්‍යානමය ව්‍යාපාර ලියාපදිංචි ලේඛනය

සංඛ්‍යානමය ව්‍යාපාර ලියාපදිංචි ලේඛනය ආර්ථික දත්ත සකස් කිරීමේදී වැදගත් මෙවලමකි. රට තුළ ප්‍රදේශීය වශයෙන් වූ නිශ්චිත ව්‍යාපාර ඒකකවල දත්ත පද්ධතියක් මෙමඟින් සපයනු ලබයි. 2013/14 ආර්ථික සංගණනයේ ලැයිස්තුගත කිරීමේ අවස්ථාවලදී සකස් කරන ලද ආර්ථික ක්‍රියාකාරකම් ඒකක පාදක කරගනිමින් ශ්‍රී ලංකාවේ සංඛ්‍යානමය ව්‍යාපාර නාමලේඛනය සකස් කර ඇත.


වඩාත් නිවැරදි ආර්ථික දත්ත ලබා ගැනීම සඳහා මෙම ලියාපදිංචි ලේඛනය ක්‍රමවත්ව යාවත්කාලීන කල යුතු වේ. දේශීය ආදායම් දෙපාර්තමේන්තුව සහ සමාගම් රෙජිස්ට්‍රාර් සමඟ ඒකාබද්ධව මෙම නාමලේඛනය යාවත්කාලීන කිරීම පළාත් පාලන ආයතනවලින් ලැබෙන දත්ත සහ කාර්මික, ඉදිකිරීම් වෙළඳ සහ සේවා අංශයන්හි වාර්ෂික සහ කාර්තුමය සමීක්ෂණ මත පදනම්ව සිදු කරනු ලැබේ.

ව්‍යාපාර ලියාපදිංචිය සිදු කිරීම සම්බන්ධයෙන් දැනුවත් කිරීමේ වැඩසටහනක් දකුණු සහ වයඹ පළාත්වල පළාත් පාලන ආයතන සහ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයන්හි නිලධාරීන් සඳහා 2018 මාර්තු මස පවත්වන ලදී.

### 3.2.6 වී අස්වැන්න ඇස්තමේන්තු කිරීම් සමීක්ෂණය

2017/18 මහ කන්නය සහ 2018 යල කන්නය සඳහා වී වගා කිරීමේ වපසරිය, මධ්‍ය වී අස්වැන්න සහ මුළු අස්වැන්න ඇස්තමේන්තු කිරීමේ සමීක්ෂණයක් සිදු කරන ලදී.

වී වර්ග, භූමි සැකසීම, පොහොර භාවිතය, වල්නාශක භාවිතය වල්නාශක භාවිතය යනාදී තොරතුරු මෙම සමීක්ෂණයේදී ලබා ගන්නා ලදී. මෙම සංගණනයේදී ලබාගනු ලැබූ දත්ත විශ්ලේෂණය කර 2017/18 මහ කන්නය සහ 2018 යල කන්නය සඳහා දිස්ත්‍රික් මට්ටමින් ප්‍රසිද්ධියට පත් කරන ලදී. එසේම ඉහත දත්ත මහවැලි කලාප සඳහා කලාප මට්ටමින් සකස් කර ඇස්තමේන්තු වෙබ් අඩවියේ පළ කරන ලදී. මෙම සමීක්ෂණය අනුව ශ්‍රී ලංකාවේ වී නිෂ්පාදනයේ විචලනය පහත රූප සටහනෙහි පෙන්වා තිබේ.




රූප සටහන 2: 2008-2018 ශ්‍රී ලංකාවේ වී නිෂ්පාදනය පිළිබඳ ඇස්තමේන්තු

### 3.2.7 උඩරට බෝග පිළිබඳව දත්ත එක්රැස් කිරීම (යල/මහ 2018)

උඩරට භෝග ප්‍රමාණයන් පිළිබඳව මූලික දත්ත වාර්තා සහ නිෂ්පාදන පිළිබඳ තොරතුරු සංක්ෂිප්ත කොට ජාතික ප්‍රතිපත්ති සම්පාදකයන් සහ අනෙකුත් ආයතන වෙත සපයනු ලැබේ.

සුළු අපනයන බෝග, පලතුරු, එළවළු, ධාන්‍ය, රනිල භෝග, ස්ථිර භෝග යනාදී කාණ්ඩ ආවරණය වන පරිදි වගාකරනු ලබන ප්‍රමාණයන් 2017/18 යල කන්නය සහ 2018 මහ කන්නය සඳහා දෙපාර්තමේන්තු වෙබ් අඩවියෙහි පලකරන ලදී. ශ්‍රී ලංකාවේ භෝග නිෂ්පාදනය පිළිබඳව තොරතුරු ලබා ගන්නා ආකාරය පහතින් දක්වා ඇත.

### 3.2.8 තේ, රබර් සහ පොල් පිළිබඳ නිෂ්පාදන පිරිවැය පරීක්ෂණය - 2017/18

2017/2018 වර්ෂයේ තේ, රබර් සහ පොල් යන ප්‍රධාන බෝග සඳහා නිෂ්පාදන පිරිවැය ඇස්තමේන්තු නිර්ණය කර තිබේ.රබර් සහ පොල් සම්බන්ද සවිස්තරාත්මක තොරතුරු ගණනය කොට ඇත. මෙම සමීක්ෂණ දත්ත භාවිතා කරගනිමින් 2017/2018 වර්ෂයේ තේ, රබර් සහ පොල් සඳහා නිෂ්පාදන පිරිවැය ඇස්තමේන්තුගත කොට ඇති අතර දෙපාර්තමේන්තු වෙබ් අඩවියේ පළ කොට ඇත.

### 3.2.9 ජාතික ගිණුම් අංශය

ජනලේඛන හා සංඛ්‍යා ලේඛන දෙපාර්තමේන්තුව විසින් කාර්තුමය සහ වාර්ෂික ජාතික ගිණුම් ඇස්තමේන්තු සකස් කිරීම සඳහා වූ වගකීම දරයි. 2017 වර්ෂයේ ජාතික ගිණුම් ඇස්තමේන්තු නිෂ්පාදන, වියදම් සහ අදායම් යන ප්‍රවේශයන් තුන ඔස්සේද , 2017 වර්ෂයේ කාර්තුමය ඇස්තමේන්තු - හතරවන කාර්තුව සඳහා , 2018 - පළමු , දෙවන සහ තුන්වන කාර්තු නිෂ්පාදන සහ පිරිවැය යන ප්‍රවේශයන් දෙකක් ඔස්සේද සකස් කොට ඇත.ජාතික ගිණුම් සංශෝධන ප්‍රතිපත්තිය අනුව , 2015 - අවසන් සංශෝධනය සහ 2016 - පළමු සංශෝධනය සිදුකොට ඇත. මෙම සියලුම ඇස්තමේන්තු කාලානුරූපිව අදාල දත්ත වගු, පුවත් වාර්තා සහ අවබෝධාත්මක වාර්තා දෙපාර්තමේන්තු වෙබ් අඩවියේ පළ කොට ඇත.

මෙම කාලපරිච්ඡේදය තුළ සියලුම ජාතික සහ ජාත්‍යන්තර දත්ත ඉල්ලීම් ඉටු කොට ඇත. 2010 සිට 2015 දක්වා පදනම් වර්ෂය වෙනස් වීමේ වැඩසටහන යටතේ , SUT "- 2015" සැකසීම ආරම්භ කොට ඇත. මෙම නැවත පදනම් වර්ෂ සකස් කිරීමේ කාර්යය ඔස්සේ, ජාතික ගිණුම් දත්ත වැඩිදියුණු කිරීමට කෘෂිකාර්මික සහ කාර්මික අංශය සඳහා සිද්ධි අධ්‍යන කිහිපයක් ගෙන ගොස් ඇත. සේවා අංශයේ කාර්යයන් සඳහා ප්‍රශ්නාවලි සකසා කාර්තුමය සමීක්ෂණ 10 ක් පැවැත්වීම සඳහා කාර්මික අංශය සඳහා බාර දී ඇත.මෙම කටයුත්ත නිමා කිරීම සඳහා මෙම සියලුම තොරතුරු, ආර්ථික සංඛ්‍යා දත්ත (2013/14) භාවිතා කොට ඇත. පදනම් වර්ෂය වෙනස් කිරීමේ කටයුත්ත සම්බන්ධව, ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ උපදේශන වටයක් 2018 වර්ෂයේදී ගෙන ගොස් ඇත.

### 3.2.10 පුස්තකාල දත්ත ගබඩා ස්වයංක්‍රියකරණය


පුස්තකාල සාමාජිකයන්ගේ සමුච්චනයන් සහ තොරතුරු පුස්තකාල දත්ත ගබඩාවට උඩුගත කිරීම 2018.06.08 ඉටුකරන ලදී. ඒවගේම මෙහි පුස්තකාල දර්ශක සහ ඩිජිටල් පුස්තකාලයක් අන්තර්ගත වේ. මෙය භාවිතා කරමින් පරිශීලකයන් හට පුස්තකාලයට යාමකින් තොරව පරිශීලනය කිරීමේ අවකාශය ලැබේ.

### 3.2.11. ශ්‍රී ලංකා ශ්‍රම බලකා සමීක්ෂණය - 2018

ශ්‍රී ලංකාවේ වෘත්තීය මට්ටම් සහ ප්‍රවණතාවයන්, සේවා වියුක්තිය සහ ශ්‍රම බලකාය මැනීම සඳහා ශ්‍රී ලංකා ශ්‍රම බලකා සමීක්ෂණය කාර්තුමය මට්ටමෙන් 1990 පළමු කාර්තුවේ සිට ක්‍රමවත්ව මෙහෙයවනු ලැබේ. Tablet පරිගණක භාවිතා කරමින් ජනවාරි සිට දෙසැම්බර් දක්වා ශ්‍රී ලංකා ශ්‍රම බලකා සමීක්ෂණයේ ක්ෂේත්‍ර කාර්යයන් සියලුම දිස්ත්‍රික්කයන් තුළ මෙහෙයවන ලදී. 2017 තුන්වන සහ හතර වන කාර්තුවල කාර්තුමය විවරණිකා සහ කාර්තුමය වාර්තාවන් දී 2018නිකුත් කොට ඇති අතර එහි වාර්ෂික විවරණිකා සහ වාර්ෂික වාර්තා ඒවගේම නිකුත් කොට ඇත. මීට අමතරව 2018 පළමු සහ දෙවන කාර්තු කාර්තුමය විවරණිකා සහ කාර්තුමය වාර්තාවන් සකසා ඇත. 2018 පළමු මාස හය සඳහා වන පරිගණක සාක්ෂරතා සංඛ්‍යා විවරණිකා සකස් කොට ඇත.

වගුව 12: ශ්‍රමම බලකා සමීක්ෂණය - 2018 (II කාර්තුව)

| දර්ශකය | ශ්‍රී ලංකාව | පිරිමි | ගැහැණු |
|---|---|---|---|
| ජනගහනය ( අවු. 15 සහ ඉහළ ) | 16,347,924 | 7,596,167 | 8,751,757 |
| ශ්‍රම බලකාය (අවු. 15 සහ ඉහළ ) | 8,351,988 | 5,507,863 | 2,844,125 |
| ශ්‍රම බලකාය සහභාගිත්ව අනුපාතය (%) | 51.1 | 72.5 | 32.5 |
| රැකියා නියුක්ති ජනගහනය | 7,970,154 | 5,336,164 | 2,633,989 |
| රැකියා නියුක්ති අනුපාතය(%) | 95.4 | 96.9 | 92.6 |
| රැකියා වියුක්ති ජනගහනය | 381,834 | 171,699 | 210,136 |
| රැකියා වියුක්ති අනුපාතය(%) | 4.6 | 3.1 | 7.4 |
| ආර්ථික වශයෙන් අක්‍රිය ජනගහනය | 7,995,937 | 2,088,304 | 5,907,632 |
| පරිගණක සාක්ෂරතාවය(I සහ II වන කර්තුවන් - 2018) | | | |
| පරිගණක සාක්ෂරතා අනුපාතය (%) | 27.5 | 29.7 | 25.4 |




*රූපසටහන 3: රැකියා වියුක්ති අනුපාතිකය වයස සහ ස්ත්‍රී, පුරුෂ භාවය අනුව රැකියා වියුක්ති අනුපාතිකය*

### 3.2.12. කුටුම්භ ආදායම් සහ වියදම් සමීක්ෂණය (HIES) - 2019

දෙපාර්තුමේන්තුව විසින් සෑම වසර 3 කට වරක්ම ජාතික කුටුම්භ නියැදි සමීක්ෂණ වැඩසටහන යටතේ කුටුම්භ ආදායම් සහ වියදම් සමීක්ෂණය (HIES) සිදුකරනු ලබයි. 2019 කුටුම්භ ආදායම් සහ වියදම් සමීක්ෂණය මෙම සමීක්ෂණ මාලාවේ 10 වන සමීක්ෂණය වන්නේය. ජන විකාශනය, පාසැල් අධ්‍යාපනය, සෞඛ්‍ය, කුටුම්භ ආදායම් සහ වියදම්, පවත්නා කල් පවත්නා භාණ්ඩ, මූලික පහසුකම් සඳහා ප්‍රවේශය,ගෘහාශ්‍රිත තොරතුරු, ඉඩම් පිළිබඳ අයිතිය, සත්ව පාලන සහ ආහාර අනාරක්ෂිතභාවය යනාදී කාණ්ඩ 16 ක් යටතේ මෙවර සමීක්ෂණය මගින් දත්ත රැස් කරයි.

එසේම,කුටුම්භයක මාධ්‍ය ආදායම හා වියදම, ඒකපුද්ගල ප්‍රාග්ධන ආදායම සහ වියදම, ආදායම් සහ වියදම් බෙදීයාමේ අසමානතාවය සහ දරිද්‍රතාවය යනාදිය සම්බන්ධව දත්තයන්ද ප්‍රකාශයට පත් කරන ලදී. රටෙහි දරිද්‍රතාවයෙන් පෙළෙන පුද්ගලයන් පිළිබඳව දැනගැනීමට සහ රට තුල ඇතිවී තිබෙන දරිද්‍රතාවය රටින් තුරන් කිරීම සඳහා අවශ්‍ය ප්‍රතිපත්තිමය තීරණ ගැනීමට මෙම සමීක්ෂණය තුළින් රැස්කර ගත්තාවූ තොරතුරු උපකාරී වෙයි. ටැබ්ලට් පරිගණක භාවිතයෙන් නියමු සමීක්ෂණයක් කිරීමත්, මූලික සැලසුම් සකස් කිරීමත් 2019 දී

සිදුකල යුතු සංස්කරණ පිළිබඳවත් සහ දත්ත සම්බන්ධ කටයුතු කිරීමට කැමැත්තක් දක්වන පාර්ශවයන්ට ඒ පිළිබඳව වැඩමුළුවක්ද දැනටමත් පවත්වා ඇත.

උපදෙස් අත්පොත ප්‍රසම්පාදනය කිරීම සහ අවසන් පෙළගැස්ම සකස්කිරීම දැනටමත් අවසන් කර ඇති අතර එම අවසන් පෙළගැස්ම අවසන් කිරීම සඳහා ක්ෂේත්‍ර නිලධාරීන් පුහුණුකිරීම ද නිම කොට ඇත.

### 3.2.13. සංචාරක වියදම් විශ්ලේෂණය (TES) - 2017/2018

මෙම සමීක්ෂණය පළමුවරට ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තුමේන්තුව (DCS) විසින් සිදුකරනු ලැබුවේ, විස්තරාත්මක ජාතික ගිණුම් සම්පාදනය කිරීම සඳහා අවශ්‍යවන දත්ත ලබාගැනීම සඳහා වේ. විශේෂයෙන්, මෙම සමීක්ෂණයේ මූලික පරමාර්ථය ලෙස චන්ද්‍රිකා දත්ත සූත්‍රගත කිරීම සඳහා අවශ්‍යවන තොරතුරු ලබාගැනීම සඳහන් කල හැක.

2017 ඔක්තෝබර් මස සිට 2018 සැප්තැම්බර් මස දක්වා සිදුකරන ලද සමීක්ෂණය මගින් සියලුම ක්ෂේත්‍ර වැඩසටහන් මුළු දිවයිනම ආවරණය වන පරිදි සිදුකොට ඇත. තවද  තවදුරටත් මෙම සමීක්ෂණයේ දත්ත සැකසුම් කටයුතු සිදුකෙරේ.

කාලය භාවිතා කරන සමීක්ෂණය ( Time Use Survey ), 2017 වසරේ වසන කාර්තුව ( ඔක්තෝබර්, නොවැම්බර් සහ දෙසැම්බර් ) තුලදී සිදුකල අතර ඒ සඳහා වෙනම වැඩසටහනක් ශ්‍රී ලංකා ශ්‍රම බලකා සමීක්ෂණය හා සමගාමීව මුළු දිවයිනම ආවරණය වන පරිදි ඒකක 6,250 ක පමණ නියැදියක් යොදා ගත් අතර එමගින් දිනකට පැය 24 ක කාලයක් පුරාවට පුද්ගලයෙක් (ඔහු/ඇය) තම කාලය වැය කිරීම පිලිබඳ තොරතුරු ලබාගන්නා ලදී. මෙම සමීක්ෂණය සඳහා නිවාසයන්ගේ ජීවත් වන වයස අවු. 10 ට වැඩි සියලුම සාමාජිකයින් යොදා ගන්නා ලදී.

සමීක්ෂණ වැඩසටහන සම්මුඛ පරීක්ෂක විසින් සම්පූර්ණ කලයුතු අතර, ඒ සඳහා සහභාගීවන පුද්ගලයින් හට දිනපොතක් නිකුත් කරනු ලබන අතර ඔහු හෝ ඇය විසින් සතියක් පුරාවට දත්ත සටහන් කලයුතු වේ. දවසක් (පැය 24) මිනිත්තු 15 කොටස් වලට වෙන්කොට, එම කාල පරාසයන් තුලදී සිදුකරනු ලබන ක්‍රියාකාරකම් (ආර්ථික, අධ්‍යාපනික, විනෝදාස්වාද හා විවේකීය) සටහන් කර ගන්නා ලෙස උපදෙස් දෙන ලදී. තවද කාලය භාවිතා කරන සමීක්ෂණ දත්තයන් පරිගණක ගත කිරීම අවසාන අදියරේ පවතී.

### 3.2.14 පර්යේෂණ ධාරිතා සංවර්ධන වැඩසටහන

මෙම වැඩසටහන හඳුන්වා දෙනු ලැබුවේ දෙපාර්තුමේන්තු නිලධාරීන්ගේ පර්යේෂණ හැකියාවන්ගේ ධාරිතාව දියුණු කිරීම සඳහා වේ. පර්යේෂණ කටයුතු සිදුකිරීම සඳහා කැමැත්තක් දක්වන නිලධාරීන් 30 දෙනෙකු දෙපාර්තුමේන්තුව මගින් තෝරාගෙන ඔවුන්ට ඒකල පර්යේෂණ කටයුතු සිදුකිරීම සඳහා අවශ්‍ය මූලික පුහුණුව ලබාදීම සිදු කරනු ලබයි. මෙම මූලික පුහුණුව මගින් ඔවුන් හට පර්යේෂණ යෝජනා සකස්කිරීම, පර්යේෂණ ක්‍රමවේදයන් සකස්කිරීම හා 'R' පරිගණක වැඩසටහන උපයෝගී කරගනිමින් දත්ත විශ්ලේෂණ කටයුතු සිදුකිරීම පිලිබඳ දැනුමක් ලබාදීම සිදු කරනු ලබයි.

### 3.2.15. නිල සංඛ්‍යාලේඛන පර්යේෂණ අධ්‍යනයන්

මෙම වැඩසටහනේ මූලික පරමාර්ථයන් වූයේ නිල සංඛ්‍යාලේකනයන්ගේ පවතින ගැටළු හඳුනාගැනීම හා පර්යේෂණ නිලධාරීන් මගින් එම ගැටළු විසඳා ගැනීම වේ. ඒ අනුව දෙපාර්තුමේන්තුව විසින් ප්‍රධාන ක්ෂේත්‍රයන් 6 ක් සිදුකරන ලද නිල සංඛ්‍යාලේඛන පිලිබඳ පූර්ණ පර්යේෂණයක් සිදුකරනු ලබයි. මේ සඳහා හඳුනාගත් විෂයන් සඳහා අවශ්‍යවන පර්යේෂණ කණ්ඩායම් පත්කරනු ලැබූ අතර මෙම හඳුනාගත් විෂයන්වල පර්යේෂණ අධ්‍යයන කටයුතු මෙම වසර තුල ආරම්භ කර ඇත. තවද මෙම පර්යේෂණ කණ්ඩායම් ස්ථාපිත කිරීම දැනට විෂයගත කරුණු පිලිබඳ අංශය හා විශේෂ අධ්‍යයන අංශයෙහි සේවය කරන නිලධාරීන්ගේ සහභාගිත්වයෙන් සිදු කරන ලදී.

**3.2.16.** **දැනුම ව්‍යාප්ත කිරීමේ වැඩසටහන**

මෙම වැඩසටහනෙහි පරමාර්ථය වන්නේ නිලධාරීන් විසින් සිදු කරගෙන යන පර්යේෂණ එළි දැක්වීමට අවස්ථාව ලබා දීම සහ අනෙකුත් නිලධාරීන්ගේ දැනුම පර්යේෂණ සම්මන්ත්‍රණ වලට සහභාගී කරවීම තුලින් ඉහළ නැංවීමයි .මෙම වැඩසටහන 2018 වසරේ දෙසැම්බර් මාසයේදී පැවැත්වීමට කටයුතු යොදා තිබුණි. නමුත් නොවැලැක්විය හැකි තත්වයන් මත මෙම වැඩසටහන 2019 ජනවාරි මුල් සති දෙක ඇතුලත පවත්වන තෙක් කල් දමන ලදී .

**3.2.17 ස්ත්‍රී පුරුෂ සංඛ්‍යා ලේඛන පිළියෙළ කිරීම**

මෙම වර්ෂයෙදී , ස්ත්‍රී පුරුෂ සංඛ්‍යා දත්ත අනුව වෙබ් පිටුව යාවත්කාලීන කිරීමට අදාල දත්ත ලබා ගැනීමට විවිධ ආයතනයන්ගෙන් ඉල්ලීම් සිදු කිරීම, ස්ත්‍රී පුරුෂ සංඛ්‍යා දත්ත ප්‍රකාශයට පත්කිරීම ,විවිධ ආයතනයන්ගෙන් ලද දත්ත තහවුරු කරගැනීම , ලැබුණු දත්ත පදනම්ව දත්ත වගු පිළියෙළ කිරීම ,දෙපාර්තමේන්තුවේ සංගණන හා මිනුම් මගින් දත්ත රැස් කිරීම ,එම දත්ත තහවුරු කර ගැනීම , අවශ්‍ය නම් වෙබ් පිටුව යාවත්කාලීන කිරීම සිදු කෙරුණි .

**3.2.18 උසස් දත්ත නිකුත් කිරීමේ දින දර්ශනය (ADRC)**

2018 වසර සඳහා උසස් දත්ත නිකුත් කිරීමේ දින දර්ශනය වසර මුලදී සිදු කරන ලද අතර එය දෙපාර්තමේන්තු වෙබ් පිටුවේ පළ කරන ලදී .ඉන් පසුව වර්ෂය පුරා එය නිසි පරිදි යාවත්කාලීන කරන ලදී .

**3.2.19 නිල සංඛ්‍යා ලේඛන වැඩසටහන (OSP)**

නිල සංඛ්‍යා ලේඛන වැඩසටහන යටතේ , විවිධ ආයතනයන්ගෙන් ලද දත්ත අනුසාරයෙන් සංඛ්‍යාන දර්ශක නිර්මාණය කර එම දර්ශක , දත්ත පරිශීලනය කරන්නන්ට ලබා ගතහැකි ආකාරයේ වැඩසටහනක් නිර්මාණය කරන ලදී .ජාතික දත්ත කමිටුව ට අනුබද්ධිත ආයතන 23 කින් සැදුම්ලත් අනුකමිටු විසින් නිළ සංඛ්‍යා ලේඛන වැඩසටහන සකස් කෙරුණි .මෙම අනුකමිටු විසින් එක් එක් අංශයට අදාළ දර්ශක හඳුනාගෙන වාර්තාවක් සකස් කෙරුණි.සියලු අනුකමිටු තම කාර්යය අවසන්කොට අදාළ වාර්තා දෙපාර්තමේන්තුව වෙත භාර දෙන ලදී. කෙසේ වුවද එම වාර්තා දෙපාර්තමේන්තු අධ්‍යක්ෂකවරුන් වෙත තවදුර සමාලෝචනය සඳහා ලබා දී ඇත .ඒ අනුව, අනුකමිටු වාර්තා අධ්‍යක්ෂකවරුන්ගේ අදහස් දැක්වීම මත සංශෝධනය කෙරේ. මෙසේ අනුකමිටු වාර්තා 23න් 13 ක් සම්පූර්ණ කෙරුණු අතර ඉතිරි වාර්තා 10 අසම්පූර්ණ බව නිරීක්ෂණය වුනු බැවින් තව දුරටත් සමාලෝචනය සිදු කෙරෙයි.

**3.2.20.** **නිල සංඛ්‍යා දත්ත සමාලෝචනය**


නිල සංඛ්‍යා දත්ත සමාලෝචනය හඳුන්වා දෙනු ලැබුවේ ,දෙපාර්තමේන්තු නිලධාරීන් විසින් සිදුකරන පර්යේෂණයන්හි පර්යේෂන වාර්තා පළ කිරීමට සහ දත්ත පරිශීලකයන් හට දෙපාර්තමේන්තුව විසින් හඳුන්වා දෙන නව වැඩසටහන් හා නව තාක්ෂණ ලිපි පළ කිරීමට ය. නිල සංඛ්‍යා දත්ත සමාලෝචනයහි පළමු අදියර 2018 වසර තුල සිදුවිය .

**3.2.21. ජාතික පාරිභෝගික මිල දර්ශකය (ජ.ප.මි .ද ): පදනම් 2013 = 100**

2015 ඔක්තෝබර් සිට නොවැම්බර් මස දක්වා උද්ධමනය පිළිබඳ නිල මිනුම් දණ්ඩ ලෙස ජාතික පාරිභෝගික මිල දර්ශකය (ජ.ප.මි.ද) සලකා බලනු ලැබේ. ජ.ප.මි .ද දිවයිනේ සෑම ප්‍රදේශයක්ම ආවරණය කරන ලද අතර රජයේ ගැසට් පත්‍ර, පුවත්පත් සහ දෙපාර්තමේන්තු වෙබ් අඩවිය මිහින් දින 21 ක කාල පමාවක් ඇතිව ඇතිව ප්‍රකාශයට පත්කරන ලදී.

2018 ජනවාරි සිට නොවැම්බර් මස දක්වා ජාතික පාරිභෝගික මිල දර්ශකයේ මූලික මිල ගණන් වෙනස්වීම් පිළිබදව දෙපාර්තමේන්තු වෙබ් අඩවියෙහි ප්‍රකාශයට පත් කෙරිණි. තවද 2018 ජනවාරි සිට නොවැම්බර් මස දක්වා නව පාරිභෝගික මිල දර්ශකයෙහි මූලික මිල වෙනස්කම් ද ඇතුලත්ව සිංහල, දෙමළ හා ඉංග්‍රීසි භාෂා මගින් දෙපාර්තමේන්තුවේ වෙබ් අඩවිය හරහා ප්‍රකාශයට පත් කරන ලදී. 2018 ජනවාරියේ සිට නොවැම්බර් දක්වා ජාතික පාරිභෝගික මිල දර්ශකයේ දැන්වීම් දිනමිණ පුවත්පත, Daily News හා Thinakaran සිංහල භාෂාවෙන් ද, ඉංග්‍රීසි සහ දෙමළ භාෂාවෙන් ද මුද්‍රණය කරන ලදී. සියලුම ජාතික පාරිභෝගික මිල දර්ශක 2018

ජනවාරි මස හා 2018 නොවැම්බර් මස කාල පරාසයක් තුල මාසිකව පදනමට යටත්ව ශ්‍රී ලංකා සමාජවාදී ජනරජයේ විශේෂ ගැසට් පත්‍රයක් මගින් ප්‍රකාශයට පත් කරන ලදී. මාසික දර්ශක ප්‍රකාශයට පත්කිරීමෙන් පසු අදාළ තොරතුරු මූල්‍ය ප්‍රතිපත්ති විශ්ලේෂණය සඳහා ශ්‍රී ලංකා මහ බැංකුවට යවන ලදී.





රූපසටහන 4: **කොළඹ පාරිභෝගික මිල දර්ශකය (කො. පා. මි. ද): පදනම් 2013 =100)**

2018, ජනවාරි මස සිට නොවැම්බර් මස දක්වා ජ.ප.මි.ද හා වසරක් පාසා උද්ධමනයෙහි හැසිරීම පහත පරිදි වේ. කම්කරු කොමසාරිස්තුමාගේ ඉල්ලීම පරිදි කරදමුංගු, කොකෝවා හා ගම්මිරිස් වගාකරුවන්ගේ ජීවන වියදම් දීමනාව ජාතික පාරිභෝගික මිල දර්ශකයේ D1-D6 කණ්ඩායමට අනුකූලව සම්පාදනය කිරීම සඳහා වැටුප් ආඥාපනත යටතේ සකස් කර 2018 වර්ෂය සඳහා ජනවාරි මස සිට නොවැම්බර් මස දක්වා මාසික පදනමට යටත්ව කම්කරු දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කරන ලදී.

### 3.2.22. කොළඹ පාරිභෝගික මිල දර්ශකය (කො. පා. මි. ද): පදනම් 2013 = 100

කොළඹ දිස්ත්‍රික්කයෙහි නාගරික ප්‍රදේශ ආවරණය කරමින් 2017 ජනවාරි මස පාරිභෝගික මිල දර්ශකය (පදනම් 2006/07 = 100 පාදය) , 2013 =100 පාදක වසර ලෙස නැවත ප්‍රතිසම්පානය විය. ඒ අනුව 2018 ජනවාරි මස සිට දෙසැම්බර් මස දක්වා කොළඹ පාරිභෝගික මිල දර්ශකය (පදනම් 2013 = 100) දෙපාර්තමේන්තුවේ වෙබ් අඩවිය හරහා සෑම මසකම අවසන් වැඩ දින නිකුත් කරන ලදී. 2018 ජනවාරි මස සිට දෙසැම්බර් මස දක්වා කොළඹ පාරිභෝගික මිල දර්ශකයෙහි මූලික මිල ගණන් වෙනස්වීම් ඇතුළත් පුවත්පත් නිවේදන, දෙපාර්තමේන්තු වෙබ් අඩවිය හරහා ප්‍රකාශයට පත් කරන ලදී. මාසික දර්ශක ප්‍රකාශයට පත් කරන විට අදාළ තොරතුරු ශ්‍රී ලංකා මහ බැංකුව සහ ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ මුදල් ප්‍රතිපත්ති විශ්ලේෂණය සඳහා යවා ඇත.




*රූපසටහන 5: කොළඹ පාරිභෝගික මිල දර්ශකය (කො. පා. මි. ද): පදනම් 2013 = 100*

### 3.2.23. පරීක්ෂණාත්මක මිලදී ගැනීම් සමීක්ෂණය

ජ .සං. දෙ. ( DCS)හි ප්‍රධාන කාර්යභාරයක් වනුයේ, ශ්‍රී ලංකාවේ කොළඹ පාරිභෝගික මිල දර්ශකය (කො.පා.මි.ද ) මාසිකව ගණනය කිරීම හා ප්‍රකාශයට පත් කිරීමයි. මිල දර්ශකය ගණනය කිරීම සඳහා , මිල තොරතුරු ලබා ගැනීමට මිල සහ වැටුප් අංශයේ නිලධාරීන් සමඟ කොළඹ දිස්ත්‍රික්කයේ නාගරික ප්‍රදේශයන්හි පරීක්ෂණ මිලදී ගැනීමේ සමීක්ෂණය සිදු කරනු ලැබේ. නිශ්චිත පිරිවිතරයන්ට අනුව තෝරාගත් භාණ්ඩ හා සේවා තොරතුරු තෝරාගත් වෙළඳ ආයතන වලින් අඛණ්ඩව එකතු කරනු ලැබේ. මෙම පරීක්ෂණ මිලදී ගැනීමේ සමීක්ෂණ තොරතුරු භාවිතා කරමින් කොළඹ පාරිභෝගික මිල දර්ශකය (කො.පා.මි.ද) සකස් කර ප්‍රකාශයට පත් කර ලදී . 2018 වර්ෂයේ කො.පා.මි.ද සකස් කිරීම සඳහා ජ .සං. දෙ. (DCS) විසින් කොළඹ නගරයෙහි නාගරික පෙදෙසෙහි පිහිටි නිශ්චිත පිරිවිතරයන්ට අනුව තෝරාගත් මිල මධ්‍යස්ථාන 14 කින් මිල

ගණන් එකතු කරනු ලැබේ. ඒ අනුව 2018 සිට ජනවාරියේ සිට දෙසැම්බර් දක්වා සියලුම මිල ගණන් තොරතුරු එකතු කර පරිගණකගත කරන ලදි.

### 3.2.24 දිස්ත්‍රික් නගරයන්හි මිල (සිල්ලර) සහ නිෂ්පාදකයාගේ මිල

මිල ගණන් හා වේතන අංශයෙහි තවත් ක්‍රියාකාරකමක් වනුයේ දිස්ත්‍රික්ක සිල්ලර හා නිෂ්පාදන මිල ගණන් එකතු කිරීමය . සිල්ලර මිල එකතු කිරීමේ ආකෘතිය පළාත් මට්ටම පදනම් කරගනිමින් සංශෝධනය කරන ලදි. එම සෑම නගරයකම සිල්ලර මිල ගණන් හා විවිධ භාණ්ඩවල මිල ගණන් සතිපතා, සති දෙකකට වරක්, මාසික හා කාර්තු වශයෙන් දෙපාර්තමේන්තු ක්ෂේත්‍ර සංඛ්‍යාලේඛන කාර්ය මණ්ඩලය යොදවා 2018 සියලු කාර්තු සඳහා එකතු කරන ලදි. 2018 වර්ෂයෙහි දේශීය වර්ධන නිෂ්පාදකයාගේ මිල ගණන් ක්‍රමවත්ව එකතු කිරීම සඳහා ප්‍රාදේශීය ලේකම්වරුන්ගේ මට්ටමින් නිෂ්පාදකයාගේ මිල ගණන්, මිල අංශයෙහි ක්ෂේත්‍ර කාර්ය මණ්ඩලය මගින් මාසිකව සිදු කරන ලදී. 2017 ජනවාරි මස සිට 2017 දෙසැම්බර් මස දක්වා කොළඹ දිස්ත්‍රික්කය තුළ තෝරාගත් භාණ්ඩ සඳහා සතිපතා සිල්ලර මිල පිළිබඳ වාර්තාවෙහි 26 වන සංස්කරණය හා 2014-2017 කාල පරිච්ඡේදය ආවරණය කරන ලද තෝරාගත් සිල්ලර හා නිෂ්පාදක මිල පිළිබඳ වාර්තාවෙහි 35 වන සංස්කරණය මුද්‍රණය කොට ප්‍රකාශයට පත් කරන ලදී. මෙම සිල්ලර සහ නිෂ්පාදකයාගේ මිල ගණන් කාර්තු පදනම මත හා දත්ත පරිශීලකයන්ගේ අවශ්‍යතාවය මත ජ .ස. දෙ. (DCS) හි ජාතික ගිණුම් අංශයෙහි ජාතික ගිණුම් සම්පාදනය කිරීම සඳහා ලබා දෙන ලදී. අත්‍යවශ්‍ය භාණ්ඩවල විවෘත වෙළඳපල සිල්ලර මිල ගණන්හි වාර්තාවක් සතියක් පාසා මූල්‍ය අමාත්‍යාංශයෙහි අදාළ කාර්ය මණ්ඩලයට හා මහ බැංකු වාර්තා වෙත යවන ලදී. මෙම සතිපතා මිල තොරතුරු ද දෙපාර්තමේන්තු වෙබ් අඩවියෙහි පළ කර ඇත.

### 3.2.25. නිෂ්පාදකයාගේ මිල දර්ශකය (නි.මි.ද): පදනම් 2013 Q4 = 100

නිෂ්පාදකයාගේ මිල දර්ශකය සම්පාදනය කිරීම සඳහා කෘෂිකාර්මික අංශයෙහි, කෘෂි නිෂ්පාදන 36 ක් පිළිබඳ තොරතුරු ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයට අදාළ දෙපාර්තමේන්තුවෙහි ක්ෂේත්‍ර කාර්ය මණ්ඩලය මගින් රැස්කරනු ලැබේ. නිෂ්පාදන අංශය සඳහා මිල තොරතුරු ආයතන 376 ක් සහ උපයෝගීතා අංශයෙහි තොරතුරු ලංකා විදුලිබල මණ්ඩලය හා ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය මගින් 2018 ජනවාරි මස සිට නොවැම්බර් මස දක්වා ගනු ලැබේ. 2018 වර්ෂයෙහි සියලුම තොරතුරු පරීක්ෂා කර පරිගණකගත කොට ඇත. දෙපාර්තමේන්තු වෙබ් අඩවිය හරහා නිෂ්පාදකයාගේ මිල දර්ශකය (නි.මි.ද): පාදම 2013 Q4 = 100 දින 45 ක් ඇතුලත දී ප්‍රකාශයට පත් කරන ලදී. 2018 ජනවාරි මස සිට නොවැම්බර් මස දක්වා, ප්‍රධාන මිල වෙනස්වීම් ඇතුළත්ව නිෂ්පාදකයාගේ මිල දර්ශකය (PPI): පාදම 2013 Q4 = 100 ඇතුලත් වෙබ් නිවේදනය දෙපාර්තමේන්තු වෙබ් අඩවිය හරහා ප්‍රකාශයට පත් කරන ලදී.

| Month | Index Number<br>2018 |
|---|---|
| January | 129.3 |
| February | 129.8 |
| March | 133.5 |
| April | 133.1 |
| May | 135.2 |
| June | 136.8 |
| July | 135.0 |
| August | 132.4 |
| September* | 129.1 |
| October* | 130.7 |
| November* | 135.7 |
| December** | 137.6 |

### 3.2.26. ජාත්‍යන්තර සැසඳීමේ වැඩසටහන

කොළඹ දිස්ත්‍රික්කයෙහි 2018 වසරේ පළමු කාර්තුව සඳහා ආසියා පැසිෆික් අන්තර්ජාතික සංසන්දන වැඩසටහන යටතේ ආසියාතික සංවර්ධන බැංකුව (ආ.ස.බැ ), විසින් මෙහෙයවනු ලබන දිවයින පුරා ආහාර අයිතම හා ආහාර නොවන අයිතම ගෘහස්ථ අංශ, යන්ත්‍රෝපකරණ සහ කොන්ක්‍රීට් කිරීම - පිළිබඳ මිල ගණන් තොරතුරු එකතු කරන ලදි. සියලුම මිල තොරතුරු පරීක්ෂා කර පරිගණකගත කර ආසියානු සංවර්ධන බැංකුව වෙත 2018 දෙවන කාර්තුවේදී යවන ලදී. 2018 වසරේ තුන්වන කාර්තුව සඳහා රට පුරා නිවාස කුලියට දීම් පිලිබඳව සමීක්ෂණයක් සිදු කරණ ලදී. 2108 වසරේ සිව්වන කාර්තුව සඳහා නිවාස කුලී සමීක්ෂණය යටතේ රැස් කරන ලද මිල තොරතුරු පරීක්ෂා කර, පරිගණකගත කර ආසියානු සංවර්ධන බැංකුව වෙත යවා ඇත. එමෙන්ම වැටුප් සඳහා මිල ගණන් එකතු කර පරීක්ෂා කර, පරිගණකගත කර ආසියානු සංවර්ධන බැංකුව වෙත යවන ලදී.

### 3.2.27. සන්නද්ධ හමුදා සඳහා ආහාර අයිතම පිළිබඳ දිනපතා වියදම් සම්පාදනය කිරීම

ආරක්ෂක අමාත්‍යාංශයෙහි ඉල්ලීම පරිදි , ත්‍රිවිද හමුදාවේ විශේෂිත නිලධාරීන් හා සෙසු නිලයන් සඳහා දක්වා ඇති ආහාර අයිතම සඳහා වියදම 2018 වර්ෂයෙහිදී මාසික පදනමට යටත්ව සම්පාදනය කිරීම සඳහා යුධ හමුදාපති වෙත ඉදිරිපත් කිරීමට නියමිතය.

### 3.2.28 ජ.ප.මි .ද නැවත සකස් කිරීම

මූලික බර තැබීමේ ව්‍යුහය හා වෙළඳපොළ බඳුන, සියළුම පළාත්, කොළඹ දිස්ත්‍රික්කය, කොළඹ දිස්ත්‍රික්කය හැරුණු කොට බස්නාහිර පළාත සඳහා සංවර්ධනය කිරීම, සමාලෝචනය හා අවසන් කිරීම ගෘහ ඒකක ආදායම් හා වියදම් සමීක්ෂණය - 2016 යොදාගෙන සිදුකරන ලදී. එමෙන්ම ජ.ප.මි .ද නැවත පදනම් කිරීම සඳහා වැඩ පත්‍රිකාවද සකස් කරන ලදී.

### 3.2.29 නි. මි. ද. ප්‍රතිස්ථාපනය කිරීම

සේවා හා ඉදිකිරීම් ඇතුළත්ව පා .මි.ද. ආවරණය පුළුල් කිරීමට නියමිතය. සේවා හා ඉදිකිරීම්හි සමස්ත මිල දර්ශකයේ බර තැබීම ආර්ථික සංගණනය 2013/14 මත පදනම්ව අවසන් කර ඇත. ඒ අනුව සංස්ථාපිත ලැයිස්තුව තෝරා අවසන්ය. සේවා සහ ඉදිකිරීම් අංශය සඳහා නියමු සමීක්ෂණයද සිදු කරන ලැබේ. සේවා සහ ඉදිකිරීම් අංශ සඳහා තොරතුරු පෝරමය සහ දත්ත එකතු කිරීමේ පෝරමය අවසන් කර ඇත.

# 4. ප්‍රතිපත්ති අධ්‍යයන ආයතනය

## 4.1 හැඳින්වීම

ප්‍රතිපත්ති අධ්‍යයන ආයතනය උසස් ප්‍රතිපත්තිමය ආර්ථික පර්යේෂණ තුළින් සමාජ - ආර්ථික සංවර්ධනය සඳහා දායක වීම අරමුණු කොටගත් ස්වාධීන ආයතනයකි.

**දැක්ම**

ශ්‍රී ලංකාවේ සමාජ - ආර්ථික පරිණාමයට යාන්ත්‍රණයක් වීම සඳහා ගෝලීය පිළිගැනීමකින් යුත් පර්යේෂණ ආයතනයක් වීම.

**මෙහෙවර**

සියළුම ශ්‍රී ලාංකික ජන ජීවිත සඳහා ධනාත්මක බලපෑමක් ඇති කිරීමට පාදක වන ප්‍රතිපත්ති රාමු සමාජ - ආර්ථික ගැටළු පිළිබඳව විශ්වසනීයත්වයකින් යුත් දැනුමක් හැඩගැසීමත් සහ අපගේ පාර්ශවකරුවන්ට ලබා දීමටත් සඳහා උසස් ගුණාත්මකභාවයෙන් යුත්, ස්වාධීන, ප්‍රතිපත්තිමය පර්යේෂණ සිදු කිරීම.

## 4.2 පර්යේෂණ

ආයතනයේ පර්යේෂණ වැඩසටහනෙහි ස්වාධීන අරමුණ වන්නේ දරිද්‍රතාවය අඩු කිරීම,යුක්තිය, තිරසර සංවර්ධනය පිළිබඳ මූලික අරමුණු ළඟා කර ගැනීම උදෙසා ශ්‍රී ලංකාව මුහුණ දෙන සංවර්ධන අභියෝග පිළිබඳ සමෝධානික විශ්ලේෂණයක් ලබා දීමයි.

ප්‍රතිපත්ති අධ්‍යයන ආයතනය පහත අරමුණු හා තේමාවන් යටතේ පර්යේෂණ වැඩසටහන් ක්‍රියාත්මක කරන ලදී .

**ප්‍රතිපත්ති සැකසීම සහ තරඟකාරී බව - වෙළඳාම තුළින් අපනයන ඉපැයුම් වැඩි කිරීම සහ වර්ධනය කිරීමට උපකාරී වන ස්ථාවර සාර්ව ආර්ථික පරිසරයක් උදෙසා**

- මැනිලාහි ආසියානු සංවර්ධන බැංකුව සමඟ ශ්‍රී ලංකාවේ සාර්ව ආර්ථික අභියෝග. මෙම අධ්‍යයනයෙන් පරීක්ෂා කරන ලද්දේ ශ්‍රී ලංකාවේ ද්විත්ව හිඟයන් පිළිබඳ සංසිද්ධීන් සම්බන්ධයෙනි. තිරසාර ආර්ථික වර්ධනයක රට පවතී නම් අභියෝග තවදුරටත් ජයගත යුතුය යන්න එම අධ්‍යයනයෙන් පිළිගෙන ඇත.
- ගෝලීය සංවර්ධන ජාලය (GDN) CEQ අධ්‍යයනය සඳහා දත්ත එක් කිරීම. දරිද්‍රතාවය සහ අසමානතාවය පිළිබඳ මූල්‍යමය ක්‍රමවේදවල බලපෑම තක්සේරු කිරීම සඳහා එක්රැස් කරන ලද පරිගණක පද්ධතියක් සහ මූල්‍ය සාධාරණත්වය පිළිබඳ තොරතුරු සහ අධීක්ෂණ ක්‍රමවේදයන් මෙම අධ්‍යයනය තුළ ඇත.
- ජිනීවාහි, ITC සහ EU සමඟ National Single Window හි අරමුණ වන්නේ වෙළඳාම සහ ප්‍රවාහන ක්ෂේත්‍රයන්හි යෙදී සිටින එම පාර්ශවයන්ට පහසුකම් සපයනු උදෙසා වෙළඳාම හා සම්බන්ධ නියාමන අවශ්‍යතාවයන් සඳහා එක් ස්ථානයකින් තොරතුරු රැස් කිරීම සහ ලේඛනගත කිරීමයි. මෙම අධ්‍යයනයෙන් සිදු කෙරෙන්නේ පාර්ශවකරුවන් හා සාකච්ඡාවන්ගෙන් GOSL මඟින් ප්‍රතිපත්ති සම්පාදනයට සලකා බැලීම සඳහා නිර්දේශ කිරීමයි.
- යෝජිත ශ්‍රී ලංකා තායිලන්ත නිදහස් වෙළඳ ගිවිසුමෙහි (SLTFTA) ප්‍රයෝජන පිළිබඳ මූලික අධ්‍යයනයක් ශ්‍රී ලංකාව හා තායිලන්තය අතර වෙළඳ මධ්‍යස්ථ බව පිළිබඳ බලපෑම පිළිබඳව විශ්ලේෂණය කිරීමට ආංශික සමතුලිතතා ආදර්ශයක් සහ ද්විපාර්ශවික වෙළඳාම සඳහා සුලබව භාවිතා කරන වෙළඳ දර්ශක අනුගමනය කරමින් තායිලන්තය සමඟ සිදු කිරීමට යෝජිත නිදහස් වෙළඳ ගිවිසුමෙහි සඵලතාවය පරීක්ෂා කිරීම ඉලක්ක කරගෙන මෙම අධ්‍යයනය සිදු කර ඇත.

**පෞද්ගලික අංශයේ සංවර්ධනය - ව්‍යාපාර කිරීමේ පරිසරය දියුණු කිරීම සහ රැකියා සහ වර්ධනය සඳහා SMES දිරි දීම**

- ගෝලීය තරඟකාරීත්වය වාර්තාව 2017 සමඟ ලෝක ආර්ථික සමුළුව ( WEF)
- වාර්ෂික ගෝලීය තරඟකාරීත්ව වාර්තාව. තනි රටවල්වල වෙළඳාම හා ආයෝජන සඳහා ආර්ථික තරඟකාරීත්වය තක්සේරු කෙරෙන වාර්තාවයි. ජාතික ප්‍රතිපත්ති ආයතනය මෙම අධ්‍යයනයේ ශ්‍රී ලංකාව සඳහා වූ අංශයේ කොටස්කාර ආයතනයයි.
- ප්‍රතිපත්තිමය පරිසරය සහ FDI මත එහි බලපෑම ගලා යාම :
- ශ්‍රී ලංකාවේ ආයෝජන වාතාවරණය සහ ඔවුන්ගේ ඇතුල්වීමේ හා පිටවීමේ රටාවන් පරීක්ෂා කිරීමට සහ ව්‍යාපාර කිරීමේ පහසුව සඳහා සමස්ත FDI ප්‍රතිපත්ති පරිසරය පිළිබඳ අවබෝධයක් ලබා ගැනීමේ උත්සාහයක් ලෙස මෙම අධ්‍යයනයෙන් විශ්ලේෂණය කෙරෙනුයේ ශ්‍රී ලංකාවේ නිෂ්පාදන ක්ෂේත්‍රය සහ ස්ථිර මට්ටමේ දත්ත පිළිබඳ නැඹුරුවීම් සහ රටාවන් පිළිබඳව වේ.
- ශ්‍රී ලංකාවේ දේශ සීමා වෙරළ විද්‍යුත් වාණිජ්‍යය පරිසර පද්ධති, ඉන්දීය කර්මාන්ත (CIR) සමඟ ඒකාබද්ධ වීම.
- ශ්‍රී ලංකාවේ විද්‍යුත් වාණිජ්‍ය පද්ධතිය තුළ දී ඇති සැලකිය යුතු වර්ධනය හේතුවෙන් මෙම අධ්‍යයනය ශ්‍රී ලංකාවේ විද්‍යුත් වාණිජ්‍ය පරිසරය හා එහි විය හැකි දේ පිළිබඳව විශ්ලේෂණයක් ලබා දීම ඉලක්ක කර ඇත.

**තිරසර සංවර්ධන උදෙසා මානව සම්පත ඵලදායී සේවා නියුක්තිය සහ ජන අනුපාත වෙනස්වීම් සහ හිතකර ජනගහනයක් නිර්මාණය කිරීම සඳහා කුසලතා සහ අධ්‍යාපන සංවර්ධනය.**

- ශ්‍රී ලංකාවේ 5 ශ්‍රේණිය ශිෂ්‍යත්ව විභාගය : ජාතික ප්‍රතිපත්ති ආයතනයේ මූල්‍ය දායකත්වය මඟින් කාර්ය සාධනය සහ ඵලදායිතාවය අගයමින්, මෙම අධ්‍යයනයෙන් ශ්‍රී ලංකාවේ 5 ශ්‍රේණියේ ශිෂ්‍යත්ව විභාගයේ අදාලතාවය එහි ඵලදායිතාවය සහ එහි අවශ්‍ය විශේෂිත ව්‍යුහගත වෙනස්කම් නිර්දේශ කිරීම සහ එම ව්‍යුහයේ සමස්ත ඵලදායිතාවය දියුණු කිරීමට පරිසරයක් සකසා දීම අරමුණු කෙරේ.
- ලෝක බැංකුව, වොෂිංටනය සමඟ ශ්‍රී ලංකාවේ පෝෂණය පිළිබඳ රාජ්‍ය වියදම් විමර්ශනය (PER)
- මෙම අධ්‍යයනයේ අරමුණ වන්නේ ජාතික ප්‍රතිපත්ති හා මාර්ගෝපදේශයන්හි දක්වා ඇති ආකාරයට ශ්‍රී ලංකාව මූලිකත්ව පෝෂණය හා විශේෂිත සංවේදී මැදිහත්වීම් සඳහා ප්‍රමාණාත්මකව මුදල් වැය කරනවාද යන්න සොයා බැලීමයි. මෙය ශ්‍රී ලංකාව, නේපාලය, ඉන්දියාව සහ භූතානය යන රටවල් 4හි පෝෂණය පිළිබඳ ප්‍රාදේශීය ක්‍රියාවලියේ කොටසකි.
- කොළඹ "Save the Children" ආයතනය 2007 දී සිදු කරන ලද මාතෘ, ළමා සෞඛ්‍ය හා පෝෂණය පිළිබඳ මූලික පර්යේෂණය
- වතු ආශ්‍රිත ව පෝෂණය සහ සෞඛ්‍ය නඟා සිටුවීම සඳහා මැදිහත්වීමක් ලෙස මෙම අධ්‍යනය මූලික තක්සේරුවක් වූ අතර ප්‍රගතිය සහ මැදිහත්වීමේ සාධනය මැනීමේ ලකුණක් ලෙස භාවිතා කළ හැක.
- වෙළඳ ප්‍රහාර පිළිබඳව සේවකයන් සැකැස්ම - ලෝක බැංකුව, වොෂිංටනය 2007
- ගෝලීය ප්‍රතිපත්ති නැඹුරුතාවයන් තුළ ශ්‍රී ලංකාවේ වෙළඳ රැකියා නියුක්තියට ඇති බලපෑම පිළිබඳව මෙම අධ්‍යයනයෙන් පරීක්ෂා කෙරේ.
- සීමිතව ඇති දත්ත අනුව නියම වැටුප් අපනයන අංශයේ කාර්යක්ෂමතාව පෙන්වන බව මෙම අධ්‍යයනයෙන් පෙනේ.

- Sri Lanka's NEET : තරුණයන් අධ්‍යාපනයේ, රැකියා නියුක්තියේ හෝ පුහුණුවේ නොවීම පිළිබඳව විග්‍රහයක් ජාතික ප්‍රතිපත්ති ආයතනයේ මූල්‍ය දායකත්වය

- මෙම අධ්‍යයනයෙන් පරීක්ෂා කෙරෙනුයේ 2016 LFS දත්ත පදනම් කොටගෙන අධ්‍යාපනයේ, රැකියා නියුක්තියේ හෝ පුහුණුවේ නොයෙදී සිටින ශ්‍රී ලංකාවේ තරුණයන් පිළිබදව වේ. මෙම අධ්‍යයනයෙන් ශ්‍රී ලංකාවේ NEETප්‍රතිශත අඩුවීම පිළිබඳව සහ වැඩිපුර තරුණ පිරිස් අධ්‍යාපනයට සහ රැකියා නියුක්තියට යොමුවීම පිළිබඳව ප්‍රතිපත්තිමය සාකච්ඡා සඳහා ප්‍රයෝජනවත්වනු ඇත.

**සංක්‍රමණය සහ නාගරීකරණය - තිරසාර සහ අපක්ෂපාතී නාගරික ජීවින තත්වය, ජීවිත නඟා සිටුවීම සඳහා රට හැර යාමේ ප්‍රවනතාවයට පහසුකම් සලසා දීම.**

- කොළඹ අන්තර්ජාතික කම්කරු සංවිධාන කාර්යාලය සමඟ සිදු කරන ලද විදේශ රැකියා නියුක්තිකයන්ගේ මුදල් ප්‍රේරණ වියදම් අවම කිරීමේ ප්‍රේරණය ක්‍රමයන් පිළිබද අධ්‍යයනය.
- මෙම අධ්‍යයනයෙන් ශ්‍රී ලංකාවේ මුදල් ප්‍රේරණ ක්‍රමයන් පිළිබඳ සාක්ෂි මත පනදම් වූ පරීක්ෂණයක් සිදු කෙරේ. මෙමඟින් ලංකාවේ නිවැසියන් ලබන 600කට වැඩි ප්‍රේරණ සඳහා වැයවන ප්‍රේරණ වියදම් අඩු කර ගැනීමට අවශ්‍ය තීරණ ගැනීමට උපකාරී වේ.

- සංක්‍රමණය පිළිබඳ අන්තර්ජාතික සංවිධානය (IOM) සමඟ සංක්‍රමණය පිළිබඳ ගෝලීය සංයුක්තය

- මෙම අධ්‍යයනයෙන් තේමාවන් අංශ 06ක් සම්බන්ධව එනම් වැරදි සංක්‍රමණයන් සහ නිවැරදි මාර්ගයන්, හොර ජාවාරම්, පාලනය, මානව හිමිකම්, සංක්‍රමණය පිළිබඳ පෙළඹීම, ඩයස්පෝරාව සහ සංවර්ධන පිළිබඳව ජාතික ප්‍රතිඵල පිළිබඳ වාර්තාවක් සකස් කිරීම සඳහා භාරගෙන ඇත.

- තාවකාලික සංක්‍රමණික සේවකයන් බඳවා ගැනීම සහ ශ්‍රී ලංකාවේ අතුරු නියෝජිතයන්ගේ කාර්ය භාරයේ වර්ධනය අබුඩාබිහි නිව්යෝක් විශ්ව විද්‍යාලයේ කම්කරු සංක්‍රමණිකයන් පිළිබඳව පර්යේෂණයක්. මෙය ගෘහස්ථ කාන්තා සේවකයන්ගේ  සේවකයන්ගේ සේවා නියුක්තිය පිළිබඳව ගල්ෆ් කෝපරේෂන් කවුන්සිල් (GCC) මඟින් සිදු කරන ලද මූලික විමර්ශනයකි. මෙහි මූලික අරමුණ සංක්‍රමණික සේවකයන් බඳවා ගැනීම සම්බන්ධව ශ්‍රී ලකාවේ අතුරු නියෝජිතයන්ගේ මැදිහත්වීම ගැන සොයා බැලීමයි.

- ප්‍රේරණයන් ඉතිරි කිරීම සම්බන්ධව සහ ඉතිරි වූ පවුල් මඟින් ණය ලබා ගැනීමේ ක්‍රමයක් - ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශය.
- මෙමඟින් සංක්‍රමණිකයන්ගේ නිවැසියන්ගේ මූල්‍යමය හැසිරීම සහ ඔවුන්ගේ ඉතිරි කිරීම් සහ ණය ලබා ගැනීමේ ක්‍රමයක් පිළිබඳව විශ්ලේෂණය කරයි. මෙය 2016 දත්ත මත පදනම් ව ඇත.

- ව්‍යාපාර ක්‍රියාවලීන් සඳහා බඳවා ගැනීම - අන්තර්ජාතික කම්කරු සංවිධානය සමඟ මෙමඟින් ලංකාවේ සේවකයන් බඳවා ගැනීමේ නියෝජිතයන් සඳහා සහ බඳවා ගැනීම් සඳහා වැයවන මුදල් පිළිබඳ පරීක්ෂා කෙරේ. මෙමඟින් බඳවා ගැනීම් නියෝජිතයන් සඳහා වැය වන මුදල බඳවා ගැනීමේ ව්යාපාර ක්‍රියාදාමයන් සඳහා වැය වන මුදල හා බඳවා ගැනීමේ ව්‍යාපාර ක්‍රියාකාරකම් පිළිබඳව පරීක්ෂා කෙරේ.
- විදේශ රැකියා වෙළඳ පොලේ බඳවා ගැනීමේ අතරමැදියන්ගෙන් - ශ්‍රී ලංකාව, සංක්‍රමණිකයන් පිළිබඳ අන්තර්ජාතික සංවිධානය සමඟ බඳවා ගැනීම් ක්‍රියාවලියේදී අතුරු නියෝජිතයන් වැදගත් කාර්ය භාරයක් ඉටු කරයි. මෙම අධ්‍යයනයෙන් දිස්ත්‍රික්ක 09ක අතුරු නියෝජිතයන්

405ක් සමාලෝචනය කෙරේ. එමඟින් පවත්නා තත්ත්වය පිළිබඳ මනා අවබෝධයක් ලැබෙනු ඇති අතර බඳවා ගැනීමේ අතරමැදියන් නියාමනයට ප්‍රතිපත්ති සැදීමේදී වැදගත් වනු ඇත.

**දරිද්‍රතාවය සහ අනතුරට බඳුන් වීම.** දරිද්‍රතාවය නැති කිරීම, අනතුරට බඳුන් විය හැකි බව අඩු කිරීම හා අසාධාරණය අවම කිරීම කිසිවෙකුත් පිටුපස නොමැති බව.

**පරිසරය,ස්වාභාවික සම්පත් සහ කෘෂිකර්මය** - කෘෂිකාර්මික හා (vcs)ඵලදායීතාවය තුලින් පරිසර හිතකාමී සංවර්ධනයත්,දේශගුණික වෙනස්වීමට ඔරොත්තු දෙන ආකාරයේ නේවාසික ස්ථාන ඇති කිරීමෙන් ඇතිවිය හැකි ආපදාවන් දරා සිටීමටත්,ආහාර ආරක්ෂණ තත්වයන් ඇති කිරීමෙන් කුසගින්න තුරන් කිරීමත් හා ගොවි මහතුන්ගේ ආදායම් ඉහල නැංවීමත් සාක්ෂාත් කර ගැනීම අරමුණ වේ.

- ඛනිජ සම්පත් අමාත්‍යාංශය සමඟ ස්වාභාවික ගෑස් පිළිබඳව ජාතික ප්‍රතිපත්තියක් ඇති කිරීම
- ස්වාභාවික ගෑස් බලශක්ති මූලයන් ලෙස සැලකිය යුතු ප්‍රතිලාභ ලබා ගැනීමට හැකි බවට ශාක්ෂි ඇත. මෙම අධ්‍යයනය, ස්වාභාවික ගෑස් භාවිතය ජාතික ප්‍රතිපත්තියක් සකස් කිරීම අරමුණ වේ.
- මිනිස් හා වන සතුන් අතර පවතින අරගලයට එක්සත් රජධානියේ International Institute for Environment and Development සමඟ එකතු වී ගොවීන් සඳහා වාණිජ රක්ෂණ ක්‍රමයක් ඇති කිරීම.
- තිරසර සංවර්ධන අරමුණු පිළිබඳ 2018 ශ්‍රී ලංකා ස්වේච්ඡා ජාතික සමාලෝචනය එක්සත් ජාතීන්ගේ සංවිධානය සමඟ මෙම වාර්තාවෙන් සමාලෝචනය වූයේ විස්තරාත්මක ජාතික ප්‍රතිපත්තියක් සහ වනජීවි සහ තිරසර සංවර්ධනය පිළිබඳ අමාත්‍යාංශයට සහ SDG සඳහා හිතකර පරිසරයක් ඇති කිරීම. ඒ සඳහා ඇති පරතරයන් සහ අභියෝග හඳුනා ගැනීමයි.
- ශ්‍රී ලංකාවේ අලි මිනිස් ගැටුම කෘෂිකාර්මික ක්ෂේත්‍රයේ නියුතු වූවන්ට උත්සන්න වෙමින් පවතින ගැටළුවක්ව පවතී.මේ මඟින් මෙම ගැටළුව අවම කිරීමට පෞද්ගලික රක්ෂණ ආයතන වලට ඇති හැකියාව සොයා බලනු ලැබේ.
- කොළඹ පිහිටි UNDP සමඟ සම්බන්ධ වී දේශගුණික විපර්යාස කෘෂි ක්ෂේත්‍රයට සිදු කරන බලපෑම අවම කිරීම.
- දේශගුණික විපර්යාස ශ්‍රී ලංකාවේ කෘෂි ක්ෂේත්‍රයට ඉතාමත් අයහපත් අකාරයට බලපා ඇත.මෙම අධ්‍යනය මඟින් මෙසේ සිදුවන පාඩුව හා හානිය ගණනය කිරීමට ක්‍රමවේදයක් සකස් කිරීම සිදුවේ.
- කැනඩාවේ IDRC ආයතනය සමග එකතුවී දේශගුණික විපර්යාසයන්ගේ බලපෑම පිළිබඳ දත්ත කළමනාකරණය කිරීමට හැකි ක්‍රමවේදයක් සැකසීම හා එමඟින් නිවැරදි තීන්දු තීරණ ගැනීමේ ක්‍රමවේදයක් සැකසීම.
- මෙම අධ්‍යනය මඟින් අදාල ක්ෂෙත්‍රයේ ප්‍රතිපත්ති සකස් කර නිෂ්පාදකයන් හා ගොවි මහතුන් හට ඵලදායී තීන්දු තීරණ ගැනීමට හැකි තත්වයක් ඇතිකිරීම.
- Millennium Challenge Corporation සමග එක්ව ඉඩම් හා ප්‍රවාහන ක්ෂේත්‍රයේ ගැටළු පිළිබඳ ආර්ථික විශ්ලේෂණය.

- මෙම අධයනය මඟින් අදාල ක්ෂේත්‍රයේ දැනට පවතින ගැටළු හඳුනා ගැනීම, ඉඩම් හා ප්‍රවාහන ක්ෂේත්‍රයන් වැඩි දියුණු කිරීමට හැකි ක්‍රම අඳුනා ගැනීම සිදුවේ.
- IFAD ව්‍යාපෘතිය යටතේ ඇති Value Chain Intervention ව්‍යාපෘතියේ ප්‍රගතිය සමාලෝචනය කිරීම.
- මේ මඟින් ව්‍යාපෘතියේ ක්‍රියාකාරිත්වය, ඵලදායීතාවය සහ ප්‍රගතිය සමාලෝචනය කිරීම සිදුවේ.
- වාණිජ හා කර්මාන්ත අමාත්‍යාංශය සමඟ එකතුවී බුද්ධිමය දේපල පිළිබඳ ජාතික ප්‍රතිපත්තියක් සැකසීම.


මේ අධ්‍යයනය මඟින් පුළුල් තත්වයෙන් යුතුව බුද්ධිමය දේපල පිළිබද ජාතික ප්‍රතිපත්තියක් සැකසීම හා නිවැරදිව එය ක්‍රියාත්මක කිරීමට හැකි උපාය මාර්ග ඇති කිරීම.

## 4.3 ප්‍රකාශන


IPS ප්‍රකාශන මඟින් එම ආයතනය මඟින් සිදුකරනු ලබන සමාජ ආර්ථික ප්‍රතිපත්ති පිළිබඳව පර්යේෂනවල ප්‍රතිඵල පළකිරීමත්,අදහස් හා යෝජනා ලබා ගැනීමත් සිදුවේ.

IPS ප්‍රකාශන:

- Sri Lanka Tea Industry in Transition: 150 years and Beyond
- Cost of Low-Skilled Migration to Saudi Arabia, South Korea and Malaysia: Value Chain Analysis - Sri Lanka
- Talking Economics (July to December 2017)
- Child Poverty in Sri Lanka: Issues Related to their Education and Access to Safe Water and Sanitation  Firm-Level Analysis of Manufacturing Sector Investment in Sri Lanka
- Regulating Sub Agents for Better Migration from Sri Lanka
- Sri Lanka: State of the Economy 2018
- Talking Economics (January to June 2018)
- Climate Change Issues in Sri Lanka: Special Issue on Integrated Climate Information Management Systems









### 4.3.1 බාහිර ප්‍රකාශන

- Can Khan Academy e-learning video tutorials improve mathematics achievements in Sri Lanka?, International Journal of Education and Development
- Sri Lanka's Macroeconomic Challenges: A Tale of Twin Deficits, ADB South Asia Working Paper Series
- School-level Resource Allocation and Education Outcomes in Sri Lanka, International Journal of Education
- Migration and Economic Remittances: Impact on Development, Routledge Handbook on Immigration and Refugee StudiesTax Rates and Tax Evasion: An Empirical Investigation of Border Tax Evasion in Sri Lanka, South Asia Economic Journal

- සම්බන්ධතා පිරිවැය පහළ දැමීම : ශ්‍රී ලංකාව සහ ඉන්දියාව අතර ගුවන් ගමන් ලිහිල්කරණය ,ලෝක බැංකුව
- සාර්ව ආර්ථික ස්ථාවරත්වය,වර්ධනය සහ ණය තිරසාරත්වය , ශ්‍රී ලංකා ආර්ථික සඟරාව
- චීන සේද මාවත හා මහා මාර්ග ආරම්භය සහ ශ්‍රී ලංකාව , National Autonomous University of Mexico
- ශ්‍රම බලකායේ කාන්තා සහභාගිත්වය ඉහළ නැංවීම ,National Institute of Labour Studies.
- සමාජ ආරක්ෂාව ,ශ්‍රම බළකාය මත ඇති කරන බලපෑම සහ රැකියා තත්ත්වය:Evidance from Sri Lanka, South Asia Press
- ශ්‍රම ලංකාවේ අන්‍යෝන්‍ය සහ ඒකාබද්ද ක්ෂුද්‍ර රක්ෂණය මත ඇති රටේ විනිශ්චය, International Cooperative and Mutual Insurance Federation

## 4.4 ප්‍රතිපත්තිමය මැදිහත්වීම්

### 4.4.1 ඉසව්/සංසද

- "ISAS Colombo Colloquium",මෙහෙයවීම IPS ,ජනවාරි 23 දින ,කොළඹ ෂැන්ග්‍රිලා හෝටලය
- "සෞභාග්‍ය සඳහා අධ්‍යාපනය සහ කුසලතා:දැනුම් පරතරය පිරවීම සඳහා ජාල ගොඩනැගීම " සාකච්ඡාවට බඳුන් කරන ප්‍රතිපත්ති මැදිහත්වීම් සාකච්ඡා මණ්ඩපය ,IPS, ජනවාරි 30 දින.
- "නව චින්තකයන්" සම්මන්ත්‍රණය, ,පෙබරවාරි 27,IPS හි දී.
- "රාජ් පෞද්ගලික නිෂ්පාදන හවුල්කාරිත්වය (4Ps ) තුලින් ප්‍රමුක හා තිරසාර කෘෂි ව්‍යාපාර සංවර්ධනය සඳහා නවෝත්පාදන මාදිලි " යන මැයෙන් අන්තර්ජාතික දැනුම් හුවමාරු කර ගැනීමේ සම්මන්ත්‍රණය ,මාර්තු 21 සිට 23 දක්වා.
- "වෙළඳ පර්යේෂණ " යන මැයෙන් ප්‍රතිපත්ති මැදිහත්වීම් සාකච්ඡා මණ්ඩපය,මාර්තු 27 දින ,IPS හි දී.
- "දේශගුණික විපර්යාස පර්යේෂණ " යන මැයෙන් ප්‍රතිපත්ති මැදිහත්වීම් සාකච්ඡා මණ්ඩපය,මැයි 27 දින ,IPS හි දී.
- " ශ්‍රී ලංකාව තුල බුද්ධිමය දේපළ ප්‍රතිපත්ති පිහිටුවීම " යන මැයෙන් පාර්ශවකරුවන්ගේ උපදේශන රැස්වීම ,IPS සමඟ වෙළඳ හා වාණිජ කටයුතු අමාත්‍යාංශය ඒකාබද්ධව මැයි 28 දින IPS හි දී .
- " ශ්‍රී ලංකාව තුල බුද්ධිමය දේපළ ප්‍රතිපත්ති පිහිටුවීම " පිලිබඳ තහවුරු කිරීමේ වැඩමුළු ,IPS සමඟ වෙළඳ හා වාණිජ කටයුතු අමාත්‍යාංශය ඒකාබද්ධව ජුනි 11 දින IPS හි දී .
- ආචාර්ය ඉන්ද්‍රජිත් කුමාරස්වාමි ,ශ්‍රී ලංකා මහ බැංකු අධිපතිතුමන් විසින් ආචාර්ය සමන් කැලේගම අනුස්මරණ දේශනය සහ "ස්ථාවරත්වය හා වර්ධනය කෙරෙහි ඇති අවස්ථා හා අභියෝග " යන මැයෙන් දේශනය , ජුනි 25, IPS හි දී .

- "පශ්චාත් අර්බුද සංවර්ධනය කෙරෙහි දේශීය සහ අන්තර්ජාතික අවස්ථා හා අභියෝග කළමනාකරණය- ශ්‍රී ලංකා උදාහරණ "පිලිබඳ ආචාර්ය .සමන් කැලේගම අනුස්මරණ සම්මන්ත්‍රණය. ටාජ් සමුද්‍ර හෝටලය , කොළඹ , ජුනි 29 හා 30 දින .
- "සංක්‍රමණය"යන මැයෙන් ප්‍රතිපත්ති මැදිහත්වීම් සාකච්ඡා මණ්ඩපය,ජුලි 31 දින ,IPS හි දී.
- "ඵලදායී අනුවර්තනය වීමේ තීරණ සඳහා දේශගුණික තොරතුරු සහ සන්නිවේදන හිදැස් පිරවීම: ඒකාබද්ද කාලගුණික තොරතුරු කළමනාකරණ පද්ධතිය , පිලිබඳ දැනුම හුවමාරු කිරීමේ වැඩමුළුව කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුව එක්ව සංවිධානය කරයි . අවානි නිවාඩු නිකේතනය,කළුතර ,අගෝස්තු 30 සහ 31 දින .
- "2018 වසරේ ශ්‍රී ලංකාවේ ආර්ථික තත්ත්වය "ප්‍රකාශනය දියත් කිරීම , ඔක්තෝම්බර් 15 දින, IPS හි දී.
- "දකුණු ආසියාවේ කෘෂිකාර්මික තාක්ෂණ නවෝත්පාදන" උපදේශන වැඩමුළුව,ඔක්තෝම්බර් 29 දින සිට 31 දින දක්වා , ගලදාරි හෝටලයේ හි දී.
- "ආහාර සුරක්ෂිතතාවය " පාර්ශ්වකරුවන්ගේ සහභාගීත්ව සංසදය,නොවැම්බර් 29 දින , IPS හි දී.

### 4.4.2 ශ්‍රී ලංකා රජයේ ප්‍රතිපත්ති සංවර්ධන කමිටුව

- ශ්‍රී ලංකා තායිලන්ත නිදහස් වෙළඳ ගිවිසුම පිලිබඳ අධ්‍යයනය සිදු කිරීම ට අදාළ කමිටුව , සංවර්ධන උපාය හා ජාත්‍යන්තර වෙළඳ අමාත්‍යාංශය .
- "ශ්‍රී ලංකා ජාතික තිරසාර සංවර්ධන දැක්ම-2030 " පිළියෙළ කිරීම සඳහා වූ විශේෂඥ කමිටුව ,ජනාධිපති ලේකම් .
- ජාතික මූල්‍යමය අන්තර්ග්‍රහණය පිලිබඳ උපායමාර්ගය නිර්මාණය කිරීම සඳහා වූ මෙහෙයුම් කමිටුව , ශ්‍රී ලංකා මහ බැංකුව .
- ජාතික මූල්‍යමය අන්තර්ග්‍රහණය පිලිබඳ උපායමාර්ගය නිර්මාණය කිරීම සඳහා වූ ක්‍රියාකාරී කණ්ඩායම , ශ්‍රී ලංකා මහ බැංකුව .
- පර්යේෂණ අධීක්ෂණ කමිටුව, විද්‍යා , තාක්ෂණ හා පර්යේෂණ අමාත්‍යාංශය .
- උසස් අධ්‍යාපනය පිලිබඳ ස්ථාවර කාරක සභාව, ජාතික අධ්‍යාපන කොමිසම.
- ශ්‍රමික ආගමනය පිලිබඳ බලකාය , ජාතික මානව සම්පත් සංවර්ධන කවුන්සිලය , ශ්‍රී ලංකාව .
- 2018 ශ්‍රී ලංකා තිරසාර සංවර්ධන ඉලක්ක වාර්තාව පිලිබඳ ස්වේච්ඡා ජාතික සමාලෝචනය බලකාය, තිරසාර සංවර්ධන හා වන ජීවී අමාත්‍යාංශය.
- ජාතික කෘෂි ව්‍යාපාර සංවර්ධන වැඩසටහන සඳහා වූ තාක්ෂණික ඇගයීම් කමිටුව, ජනාධිපති ලේකම් .
- සමාජ ආර්ථික පර්යේෂණ සඳහා කමිටුව ,කෘෂිකාර්මික පර්යේෂණ ප්‍රතිපත්ති කවුන්සිලය, කෘෂි කාර්මික අමාත්‍යාංශය .

# 5. සුවසැරිය පදනම

## 5.1 හැදින්වීම

ප්‍රථම ගාස්තු රහිත ගිලන් රථ සේවය වන "1990 සුව සැරිය " සේවාව , ශ්‍රී ලංකාව තුල එලදායී හා ගුණාත්මක පූර්ව රෝහල් හදිසි ප්‍රතිකාර සේවයක් ලබා දීම අරමුණින් 2016 ජුලි 28 වන දින දකුණු පළාත සහ බස්නාහිර පළාත ආවරණය වන පරිදි අංග සම්පූර්ණ ගිලන් රථ 88 කින් සහ රාජගිරිය හදිසි මෙහෙයුම් සහ පාලන මූලස්ථානය කින් සමන්විතව ආරම්භ කරන ලදී . 1990 සුව සැරිය පදනම ස්ථාපිත කිරීමට අදාල නීති කෙටුම් පත, පදනම ස්ථාපිත කිරීමට අදාල පරිපාලන සහ කළමනාකරණ කටයුතු කළමනාකරණ මණ්ඩලය වෙත පවරමින් 2018 ජුලි 4 වන දින ගැසට් කරන ලදී .

මෙම විශිෂ්ට සේවාව මූලිකවම ඩොලර් මිලියන 7.55 ක ඉන්දියානු ජනරජයේ මූල්‍ය ප්‍රධාන සහිතව ආරම්භ වු අතර අඛණ්ඩව පවත්වාගෙන යාම ශ්‍රී ලංකා රජයේ ප්‍රතිපාදන මගින් සිදුකරනු ලබයි. "1990 සුව සැරිය " ගාස්තු රහිත සේවාව වෙත ලැබෙනා සියලු ඇමතුම් වෙත ඉතා ඉක්මන් ප්‍රතිචාර දැක්වීම එහි හදිසි මෙහෙයුම් සහ පාලන මූලස්ථානය තහවුරු කරයි .හදිසි ඇමතුම් ප්‍රතිචාර නිලධාරියා හදිසි අවශ්‍යතාවය හෝ රෝග ලක්ෂණ තක්සේරු කර ප්‍රමාදයකින් තොරව මනා පළපුරුද්දක් සහිත හදිසි වෛද්‍ය තාක්ෂණ ශිල්පියෙකු හා මනා සහයෝගක් ලබාදෙන ගිලන්රථ නියමුවෙකු සහිතව ගිලන්රථයක් පිටත් කර ආපදාවට ලක් වූ අයට ගුණාත්මක පූර්ව රෝහල් හදිසි ප්‍රතිකාර සේවයක් ලැබුණු බවට සහ සුදුසු රෝහල වෙත ප්‍රවාහනය වන බවට තහවුරු කරයි .

පළමු අදියරේ මෙහෙයුම් යටතේ , අංග සම්පූර්ණ ගිලන් රථ 88 කින් සහ දිවයිනේ දිස්ත්‍රික්ක 6ක පුරා විසිරුණු 552 ක පුහුණු තරුණ ශ්‍රම බලකායකින් සමන්විත කාර්ය මණ්ඩලයක් විසින් මෙම සේවාව මිලියන 8 කට ආසන්න දකුණු හා බස්නාහිර පළාත් වෙත සේවය සලසා ඇත.දෙවන අදියර මෙහෙයුම්, 2018 ජුලි 21 දින රට පුර ව්‍යාප්ත කරමින් ඩොලර් මිලියන 15.02 ක ඉන්දියානු ජනරජයේ මූල්‍ය ප්‍රධාන සහිතව දියත් කරන ලදී .මෙම සේවය දීප ව්‍යාප්තව පුළුල් කිරීමට ගිලන්රථ 209ක් හා නිපුන ශ්‍රී ලංකික තරුණ ශ්‍රමිකයන් 1446 වඩා වැඩි පිරිසකගෙන් සමන්විත ඒකකය , ශ්‍රී ලංකා රජය විසින් "1990 සුව සැරිය පදනම " පිහිටුවන ලදී .දෙවන අදියර දියත් කිරීමත් සමඟ දකුණු සහ බස්නාහිර පළාත් වල ක්‍රියාත්මක ගිලන්රථ 88 ට අමතරව, තවත් ගිලන්රථ 168 ක් උතුරු ,වයඹ ,උතුරු මැද,ඌව ,මධ්‍යම සහ සබරගමුව යන පළාත් වල යොදවන ලදී .

2019 වසරේ මැයි මස වන විට නැගෙනහිර පළාතේ ද ආරම්භ කිරීමට නියමිතය. තවද අදියර II අවසානයේදී ගිලන්රථ 297 ක් මුළු දිවයිනම ආවරණය වන පරිදි යෙදවීමට නියමිතය.

නවීන තාක්ෂනයන් උපයෝගී කරගෙන ක්‍රියාත්මක කරන 1990 සුවසැරිය ගිලන්රථ සේවය තාක්ෂණය පාදක කරගත් මෙහෙයවීමකි.
දැනට දිනකට දුරකථන ඇමතුම් 1700 කට වඩා හසුරුවන සුවසැරිය සේවයට ආරම්භයේ සිට මේ දක්වා දුරකථන ඇමතුම් 801,863 කට වඩා වැඩි ප්‍රමාණයක් ලැබී ඇත. ඉන් ඇමතුම් 98.9% කටම තත්පර දෙකක කාලයක් තුල 98.9% ක් එම දුරකථන ඇමතුම් වලට පිළිතුරු දී ඇත. 2016 ජුලි 28 සිට වර්තමානය දක්වා දිනකට රෝගීන් 470 කට අධික සංඛ්‍යාවක් දිනපතා ප්‍රවාහනය කරනු ලබන අතර මේ දක්වා රෝගීන් 128,747 ක් රෝහල් ගතකර ඇත. සාර්ථකව ආවරණය කරන ලද අවස්ථා

අතුරින් රෝහල වෙත ගමන්කරන අතර මැදදී ගිලන්රථ තුල දරු උපත් 81 සාර්ථකව සිදුවීම විශේෂත්වයකි. මිනිත්තු 2 කට වඩා අඩු කාලයකදී රෝගියා පිළිබඳව ඇමතුම ලැබී ගිලන් රථය පණගන්වා විනාඩි 12 ක් සහ තත්පර 59 ක් වැනි කෙටි කාලයකදී ප්‍රතිචාර දක්වන ලද හදිසි අවස්ථා සංඛ්‍යාව 169,803 කට වඩා වැඩි වේ. මූලික හදිසි ප්‍රතිකාර සේවාව ඉක්මවා ගොස් රෝගීන්ගේ පාර්ශවයෙන් පැය 48 කට පසු සියලු සිදුවීම් පසු විපරම් කෙරේ. එපමනක් නොව, සතියේ දින හතේම පැය විසි හතරේම ඉක්මනින් හා ඵලදායිව සන්නිවේදනය සිදුවීම සඳහා ද අවශ්‍ය විටක නීතිය බලාත්මක කිරීම සඳහාද මෙම ගිලන් රථ පොලිස් මුරපොල වල අණදෙන පාලක මැදිරිය තුළ ස්ථානගත වී ඇත. " 1990 සුව සැරිය" නොමිලේ ගිලන් රථ සේවාව රටේ අතිශයින් අවශ්‍ය පූර්ව රෝහල් සේවා සපයනු ලබනවා පමණක් නොව 2000 ක් පමණ වූ ශ්‍රී ලංකික තරුණ තරුණියන්ට රැකියා අවස්ථා ලබා දෙන්නක් වේ. අඛණ්ඩ වැඩිදියුණු කිරීම සහ අති දක්ෂ පුහුණු කාර්ය මණ්ඩලයක් කැපවීමත් සමග 1990 "සුව සැරිය" තවත් බොහෝ ජීවිත බේරාගැනීමට කටයුතු කරනු ඇත.

මේ වන විට අඛණ්ඩව සිදුකරන නව්‍යකරණ හා ප්‍රතිසංවිධාන කටයුතු ඉදිරි වසර වලදී ද සිදුකරණු ඇති අතර එමගින් වැඩිවන හා වෙනස් වන දියුණු කිරීමත් සමග රටේ වර්ධනය වෙමින් පවතින වෙනස්වන අවශ්‍යතාවයන්ට අනුකූලව තවදුරටත් ඉදිරියට යනු ඇත.

### අදියර II දියත් කිරීම

වගුව 13: අදියර II දියත් කිරීම

| පළාත | ආරම්භ කල දිනය | වෙන්කරන ලද ගිලන්රථ ගණන |
|---|---|---|
| උතුර | ජූලි 2018 | 21 |
| ඌව | අගෝස්තු 2018 | 27 |
| උතුරු මැද | සැප්තැම්බර් 2018 | 22 |
| වයඹ | ඔක්තෝබර් 2018 | 31 |
| සබරගමුව | නොවැම්බර් 2018 | 27 |
| මධ්‍යම | දෙසැම්බර් 2018 | 43 |


**කාර්ය සාධනය හා කාර්යසාධන දර්ශක**

2018 ජනවාරි 01 සිට දෙසැම්බර් 31 දක්වා කාල පරිච්ඡේදය තුල සුව සැරිය ගිලන්රථ සේවය විසින් සිදු කරන ලද සේවා සංඛ්‍යාව 84,297 ක් වන අතර එය ආරම්භයේ සිට සිදුකරන ලද සමස්ථ මෙහෙයුමෙන් 59% කි. මෙය සේවාව පුළුල් කිරීමත් සමඟ සිදුවූ වැඩිවීමකි.

වගුව 14: සෑම මසකම මෙහෙයවූ සිදුවීම් ගණන


| මාසය | සිදුවීම් ගණන |
|---|---|
| ජනවාරි -18 | 5,807 |
| පෙබරවාරි -18 | 5,224 |
| මාර්තු -18 | 5,779 |
| අප්‍රියල් -18 | 5,519 |

| | |
|---|---|
| මැයි -18 | 5,765 |
| ජූනි -18 | 5,730 |
| ජූලි -18 | 6,072 |
| අගෝස්තු -18 | 6,892 |
| සැප්තැම්බර් -18 | 7,769 |
| ඔක්තෝබර් -18 | 9,242 |
| නොවැම්බර් -18 | 9,767 |
| දෙසැම්බර් -18 | 10,731 |
| එකතුව | 84,297 |




රූප සටහන 6: සෑම මසකම මෙහෙයවූ සිදුවීම් ගණන


**එම සිදුවීම් 84,297 වලින් 56% ක් බස්නාහිර පළාතෙන් ද, 31%ක් දකුණ පළාතෙන් ද 4.5% ක් උතුරු පළාතෙන් ද වේ.**




| | Jan-18 | Feb-18 | Mar-18 | Apr-18 | May-18 | Jun-18 | Jul-18 | Aug-18 | Sep-18 | Oct-18 | Nov-18 | Dec-18 |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| Southern Province | 2180 | 1933 | 2200 | 2177 | 2017 | 1883 | 2094 | 2144 | 2229 | 2406 | 2345 | 2434 |
| Western Province | 3627 | 3291 | 3579 | 3342 | 3748 | 3847 | 3978 | 4098 | 4214 | 4555 | 4456 | 4607 |
| Uva Province | | | | | | | | 106 | 698 | 937 | 782 | 778 |
| Nothern Province | | | | | | | | 544 | 628 | 857 | 858 | 937 |
| North Central Province | | | | | | | | | | 487 | 714 | 904 |
| North Western Province | | | | | | | | | | | 612 | 727 |
| Central Province | | | | | | | | | | | | 308 |
| Sabaragamuwa Province | | | | | | | | | | | | 36 |


*රූප සටහන7: පළාත් අටක් අතර* ***සිදුවීම්*** *බෙදා හැරීම*

සේවයේ කාර්යක්ෂමතාව නිර්ණය කිරීමේ ප්‍රධාන දර්ශකය ලෙස සාමාන්‍ය ප්‍රතිචාර කාලය සැලකේ. රෝගියාගේ පාර්ශවයෙන් ඇමතුමක් ලබා ගැනීමෙන් පසු රෝගියාගේ ස්ථානයට ගිලන් රථය ළඟා වීමට ගතවන කාලය ප්‍රතිචාර දැක්වීමේ කාලය ලෙස මනිනු ලැබේ. **2018** දෙසැම්බර් **31** වන දිනට සාමාන්‍ය ප්‍රතිචාර දැක්වීම **12:58** ලෙස වාර්තා විය. එක් එක් පළාතේ පළමු අදියර හා දෙවන අදියරේදී ප්‍රතිචාර දැක්වීම් කාලය වෙන වෙනම ගණනය කරන ලදී.




| | Jan | Feb | March | April | May | June | July | Aug | Sep | Oct | Nov | Dec |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| Western Province | 0:08:35 | 0:08:53 | 0:10:05 | 0:09:11 | 0:09:29 | 0:09:03 | 0:09:16 | 0:09:13 | 0:08:03 | 0:07:53 | 0:08:24 | 0:08:13 |
| Southern Province | 0:10:13 | 0:10:38 | 0:11:55 | 0:10:57 | 0:11:30 | 0:11:03 | 0:11:17 | 0:11:03 | 0:11:04 | 0:10:15 | 0:10:26 | 0:11:06 |


රූප සටහන 8: මාසික සාමාන්‍ය ප්‍රතිචාර කාලය - අදියර I




| | Northern | Uva | North Central | North Western | Central | Sabaragamuwa |
|---|---|---|---|---|---|---|
| Average Response Time August | 0:11:45 | 0:08:23 | 0:00:00 | 0:00:00 | 0:00:00 | 0:00:00 |
| Average Response Time September | 0:10:49 | 0:11:38 | 0:06:04 | 0:00:00 | 0:00:00 | 0:00:00 |
| Average Response Time October | 0:11:53 | 0:12:13 | 0:10:29 | 0:07:20 | 0:00:00 | 0:00:00 |
| Average Response Time November | 0:11:31 | 0:13:21 | 0:12:02 | 0:08:38 | 0:05:59 | 0:00:00 |
| Average Response Time December | 0:11:41 | 0:11:54 | 0:11:44 | 0:08:45 | 0:11:04 | 0:10:47 |

*රූප සටහන 9: මාසික සාමාන්‍ය ප්‍රතිචාර කාලය - අදියර II*

**සිදුවීම් බෙදී ගිය ආකාරය**




රූප සටහන 10: සිදුවීම් බෙදී ගිය ආකාරය

**මානව සම්පත්**

**2018 දෙසැම්බර් 31 දින වන විට 1208 සේවක සංඛ්‍යාවක් සිටි අතර 2019 වන විට එය 1998 දක්වා විය.**

වගුව 15: මාසිකව බඳවාගත් නිලධාරීන්

| වසර | මාසය | තනතුර | හිස් සංඛ්‍යාව |
|---|---|---|---|
| 2018 | පෙබරවාරි | හදිසි ප්‍රතිචාර නිලධාරී | 8 |
| | | හදිසි වෛද්‍ය තාක්ෂණ ශිල්පි | 40 |
| | | වෙනත් | 3 |
| 2018 | මාර්තු | හදිසි වෛද්‍ය තාක්ෂණ ශිල්පි | 96 |
| 2018 | මැයි | වෙනත් | 2 |
| 2018 | ජුනි | රියදුරු | 62 |
| | | හදිසි වෛද්‍ය තාක්ෂණ ශිල්පි | 40 |
| 2018 | ජූලි | හදිසි ප්‍රතිචාර නිලධාරී | 5 |
| | | හදිසි වෛද්‍ය තාක්ෂණ ශිල්පි | 56 |
| | | රියදුරු | 52 |
| | | වෙනත් | 1 |
| 2018 | අගෝස්තු | හදිසි ප්‍රතිචාර නිලධාරී | 5 |
| | | වෙනත් | 3 |
| | | හදිසි වෛද්‍ය තාක්ෂණ ශිල්පි | 53 |
| | | රියදුරු | 46 |
| 2018 | සැප්තැම්බර් | වෙනත් | 1 |
| 2018 | ඔක්තෝබර් | හදිසි වෛද්‍ය තාක්ෂණ ශිල්පි | 111 |
| | | රියදුරු | 97 |
| 2018 | නොවැම්බර් | රියදුරු | 51 |
| | | හදිසි ප්‍රතිචාර නිලධාරී | 3 |

| | | | |
|---|---|---|---|
| 2018 | දෙසැම්බර් | හදිසි වෛද්‍ය තාක්ෂණ ශිල්පි | 56 |
| | | වෙනත් | 2 |

**පුහුණුව**
සෑම හදිසි වෛද්‍ය තාක්ෂණ ශිල්පින් සහ  සහ රියදුරන් සඳහා  අංශ තුනකින් පුහුණුව සමන්විත වේ.

a. ආරම්භක මූලික පුහුණුව
b. මෘදු නිපුණතා පුහුණුව
c. නැවුම් පුහුණුව

**a. ආරම්භක මූලික පුහුණුව**

දින 52 ක පුහුණු වැඩසටහන සඳහා ඉන්දියාවේ **GVK EMRI** පුහුණු ආයතනය වෙත යැවීමට සියලු හදිසි වෛද්‍ය තාක්ෂණ ශිල්පින් තෝරාගනු ලැබීය. හදිසි වෛද්‍ය තාක්ෂණ ශිල්පින් ලෙස ක්‍රියා කිරීමට අවශ්‍ය  වන සියලුම න්‍යායාත්මක දැනුම ලබා ඇත. ඔවුන්ට ගාන්ධි අනුස්මරණ රෝහල සහ සේවයේ පුහුණුවීම් සඳහා **GVK EMRI** රෝහල් ගිලන් රථ සේවාව ලබා දෙනු ඇත. ඔවුන් ආපසු පැමිණීමෙන් අනතුරුව 1990 සුව සැරියෙහි  ක්‍රියාකාරී සේවයේ යෙදීමට පෙර ප්‍රයෝගික පුහුණුව ලබා දීමට කටයුතු කර ඇත.

සියලුම තෝරාගත් රියදුරන්**,** ගිලන් රථ  පැදවීමේ නිපුණතාව**,** ගිලන් රථය නඩත්තු කිරීමේ තාක්ෂණික කුසලතාවය **,** ප්‍රථමාධාර පුහුණුව සහ රෝගී චලන සහ එසවුම් කුසලතා පවත්වාගෙන යාම සම්බන්ධ තාක්ෂණික කුසලතා වලට මුහුණ දෙනු ඇත.

**b. මෘදු නිපුණතා පුහුණුව**

සියලුම හදිසි වෛද්‍ය තාක්ෂණ ශිල්පින් සහ රියදුරන් හදිසි අවස්ථා අණ හා මෙහෙයුම් මණ්ඩලවල කාර්යමණ්ඩලය පීඩාවට පත් වූ රෝගී සහ ස්වයං මානසික ආතති කළමනාකරණය සම්බන්ධයෙන් මෘදු නිපුණතා පුහුණුවකට ලක්වේ.

**c. නැවුම් පුහුණුව**

සෑම රියදුරෙකුම සහ හදිසි වෛද්‍ය තාක්ෂණ ශිල්පියෙකුම  තාක්ෂණික වශයෙන් දැනුවත්වීම සඳහා අඛණ්ඩ පුහුණුවකට ලක් කිරීම අවශ්‍ය වේ. එබැවින් සියලුම හදිසි වෛද්‍ය තාක්ෂණ ශිල්පියෙකුම සෑම මාස **3** කට වරක් මොඩියුල **4**ක් අතුරින් **1** මොඩියුලයක මනා පුහුණුවක් ලබා ගනී. හදිසි වෛද්‍ය තාක්ෂණ ශිල්පී පුහුණුකිරීම් **Sri Lanka Society of Critical Care and Emergency Medicine** මගින් කරනු ලබයි.

**2019** දී රියදුරුවරුන් සහ හදිසි අවස්ථා අණ හා මෙහෙයුම් මණ්ඩලවල කාර්යමණ්ඩලයද මීට සමාන පුහුණුවක් ලබනු ඇත.

වගුව 16: 2018 සේවක පුහුණුව

| මාසය | කාණ්ඩ විස්තර | හිස් සංඛ්‍යාව | පුහුණු ආකාරය |
|---|---|---|---|
| ජනවාරි | - | - | - |
| පෙබරවාරි | හදිසි වෛද තාක්ෂණ ශිල්පීය සයවන කාණ්ඩය | 41 | පදනම් පුහුණු + මෘදු නිපුණතා |
| මාර්තු | හදිසි වෛද්‍ය තාක්ෂණ ශිල්පි සත්වන කාණ්ඩය | 50 | පදනම් පුහුණු + මෘදු නිපුණතා |
| | හදිසි වෛද්‍ය තාක්ෂණ ශිල්පි අටවන කාණ්ඩය | 46 | පදනම් පුහුණු + මෘදු නිපුණතා |
| ජූනි | මොරගල රියදුරු කාණ්ඩය | 31 | රියදුරු පුහුණු වැඩසටහන |
| | මොරගල රියදුරු කාණ්ඩය | 31 | මෘදු නිපුණතා |
| | බදුල්ල රියදුරු කාණ්ඩය | 32 | රියදුරු පුහුණු වැඩසටහන |
| | බදුල්ල රියදුරු කාණ්ඩය | 32 | මෘදු නිපුණතා |
| | හදිසි වෛද්‍ය තාක්ෂණ ශිල්පි නවවන කාණ්ඩය | 40 | පදනම් පුහුණු + මෘදු නිපුණතා |
| | හදිසි වෛද්‍ය තාක්ෂණ ශිල්පි අපේක්ෂක | 20 | සායනික හා දේශන |
| ජූලි | උතුරු රියදුරු කාණ්ඩය | 52 | රියදුරු පුහුණු වැඩසටහන |
| | උතුරු රියදුරු කාණ්ඩය | 52 | මෘදු නිපුණතා |
| | හදිසි වෛද්‍ය තාක්ෂණ ශිල්පි දසවන කාණ්ඩය | 56 | පදනම් පුහුණු + මෘදු නිපුණතා |
| අගෝස්තු | උතුරු මැද රියදුරු කාණ්ඩය | 50 | රියදුරු පුහුණු වැඩසටහන |
| | උතුරු මැද රියදුරු කාණ්ඩය | 50 | මෘදු නිපුණතා |
| | හදිසි වෛද්‍ය තාක්ෂණ ශිල්පි එකොලොස්වන කාණ්ඩය | 53 | පදනම් පුහුණු + මෘදු නිපුණතා |

| | | | |
|---|---|---|---|
| සැප්තැම්බර් | පුහුණු උපදේශක | 1 | APLS |
| ඔක්තෝබර් | වයඹ රියදුරු කාණ්ඩය | 49 | රියදුරු පුහුණු වැඩසටහන |
| | වයඹ රියදුරු කාණ්ඩය | 49 | මෘදු නිපුණතා |
| | හදිසි වෛද්‍ය තාක්ෂණ ශිල්පි දොළොස්වන කාණ්ඩය | 53 | පදනම් පුහුණු + මෘදු නිපුණතා |
| | මධ්‍යම රියදුරු කාණ්ඩය | 48 | රියදුරු පුහුණු වැඩසටහන |
| | හදිසි වෛද්‍ය තාක්ෂණ ශිල්පි දහතුන්වන කාණ්ඩය | 58 | මෘදු නිපුණතා |
| | 1st 24 EMTs/Colombo | 24 | නවක පුහුණු වැඩසටහන |
| | 2nd 24 EMTs/Colombo | 24 | නවක පුහුණු වැඩසටහන |
| | කොළඹ මිශ්‍ර රියදුරු කාණ්ඩය | 24 | රියදුරු පුහුණු වැඩසටහන |
| | කොළඹ මිශ්‍ර රියදුරු කාණ්ඩය | 24 | මෘදු නිපුණතා |
| | සබරගමුව රියදුරු කාණ්ඩය | 27 | රියදුරු පුහුණු වැඩසටහන |
| | සබරගමුව රියදුරු කාණ්ඩය | 27 | මෘදු නිපුණතා |
| නොවැම්බර් | හදිසි කලමනාකරණ විධායකයින් සහ පුහුණු උපදේශක | 24 | SLEMCON Basic |
| දෙසැම්බර් | හදිසි වෛද්‍ය තාක්ෂණ ශිල්පි දහහතරවන කාණ්ඩය | 57 | පදනම් පුහුණු + මෘදු නිපුණතා |

**අඛණ්ඩව සිදුකරන සේවා වර්ධනය**

ගිලන්රථ සේවයේ ප්‍රථම අදියරේ ලබාගත් අත්දැකීම් හා අවබෝධයන් මත මෙහි දෙවන අදියර සකස් කිරීම හා නිර්මාණය සිදුකර ඇත.

මේ අනුව 75, 4*4 ගිලන්රථ බලකායන් අවශ්‍ය ප්‍රදේශ සඳහා යොදවා ඇත. BBC මගින් කරන ලද සමීක්ෂණය අනුව විනාඩි **1** ක ප්‍රමාදය තුලින් ජීවිත බේරාගැනීමට ඇති හැකියාව **10%** කින් අඩු කරයි. මේ අනුව ගිලන් රථ රෝගියාගේ ස්ථානයට ඉක්මනින් කඩිනමින් ලඟා වීමට අත්‍යවශ්‍ය බැවින් මෙම ගිලන්රථ ක්‍රියාත්මක කිරීම ගූගල් රථ ගමනා ගමනය (google traffic) හරහා සිදු කරනු ලැබේ. එසේම ඒ ගිලන් රථ සඳහා කැමරා පද්ධති දෙකක් සවිකර ඇත.

මේ සඳහා යොදවා ඇති කාර්ය මණ්ඩලයට අවශ්‍ය දෛනික ශාරීරික පුහුණුව ලබාගැනීම සඳහා ද කටයුතු යොදා තිබීම මගින් ඔවුන් ඕනෑම හදිසි කටයුත්තක් සඳහා සූදානම් බව තහවුරු කර ඇත.

මෙහි ක්‍රියාකාරකම් තුල රෝගීන් ඉසිලීම හා රැගෙන යාම වැනි අවස්ථාවලදී අවශ්‍ය වන කුසලතා ද ඇතුලත්ව ඇත.